# වාර්ෂික වාර්තාව 2019

අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ

ජාතික අධිකාරිය

428/11ඒ, පළමු මහල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
දුරකථන: +94112879539 ෆැක්ස්: +94112879540
ඊ - මේල්: witness.protection.srilanka@gmail.com

# පටුන


- සභාපතිතුමාගේ පණිවුඩය 03
- අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවුඩය 04
- දැක්ම සහ මෙහෙවර 05
- විධායක සාරාංශය 6-8
- හැඳින්වීම 9-10
- අරමුණු 11
- වින්දිතයන් හා සාක්ෂිකරුවන්ගේ අයිතිවාසිකම් හා හිමිකම් 12-13
- අධිකාරියේ කාර්ය හා කර්තව්‍යයන් 14-16
- පොලිස් සහායක සහ ආරක්ෂක කොට්ඨාසය 17-18
- කළමනාකරණ මණ්ඩලය - 2019 19-20
- කාර්ය මණ්ඩලය - 2019 21-24
  - ✓ ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩලය
  - ✓ සහාය කාර්ය මණ්ඩලය
    - කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන)
    - රියදුරු
    - කාර්යාල කාර්ය සහායක
    - කාර්ය මණ්ඩල සාරාංශය
- කාර්ය සාධන වාර්තාව 25-55
- මූල්‍ය ප්‍රගතිය (අවසාන ගිණුම්) 56-77
- විගණන වාර්තාව 78-83

# සභාපතිතුමාගේ පණිවුඩය



අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට අපරාධ යුක්තිය පසිඳලීමේ යාන්ත්‍රණයට සහභාගී වීමේදී ද්විතික වින්දිතභාවයට පත්වීම, අපරාධකරුවන්ගෙන් සිදුවන පීඩා, බලපෑම්, තර්ජනය කිරීම් ආදිය හේතුවෙන් ඔවුන්ගේ අයිතිවාසිකම් සහ හිමිකම් කඩවීම් ආරක්ෂා කිරීම සඳහා විධිමත් වැඩපිළිවෙළක අවශ්‍යතාවය කෙරෙහි 2005 වර්ෂයේ සිට ශ්‍රී ලංකාවේ මෙන්ම අන්තර්ජාතික වශයෙන්ද අවධානයක් යොමු විම විශේෂත්වයකි. මෙකී සියලු කර්තව්‍යයන්හි ප්‍රතිඵලයක් වශයෙන් 2015 මාර්තු මස 13 වන දින 2015 අංක 04 දරන අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමේ හා ආරක්ෂා කිරීමේ පනත පාර්ලිමේන්තුවේ ඒකමතිකව සම්මත වීම ශ්‍රී ලංකා නීති ඉතිහාසයේ වැදගත් සන්ධිස්ථානයක් ලෙස සලකමි.

එලෙස බල ගැන්වූ අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමේ හා ආරක්ෂා කිරීමේ පනත ප්‍රකාරව, 2016 ජනවාරි මස 08 වන දින අප ආයතනය ආරම්භ කරන ලද අතර, 2016 මැයි මස 18 වන දින සිට බලපැවැත්වෙන පරිදි අධිකරණ ඇමතිතුමාගේ අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ආයතනයක් ලෙස අතිවිශේෂ ගැසට් අංක 1967/8 මඟින් ස්ථාපනය කරන ලදී.

මෙම පනතේ කාර්යයන් සහ කර්තව්‍යයන් ඉටු කිරීම සඳහා පිහිටුවන ලද අප ජාතික අධිකාරිය සහ අපරාධයක වින්දිතයන්ගේ සහ සාක්ෂිකරුවන්ගේ සහායක සහ ආරක්ෂක කොට්ඨාසය මේ වන විට ඉතාමත් සක්‍රීයව කටයුතු කරනු ලබයි. මූලික අවධියේ දී එනම් 2016 සහ 2017 වර්ෂයන් තුළදී නව්‍ය ආයතනයක් ලෙස පිහිටවූ අප ආයතනය 2018 සහ 2019 වර්ෂයන් තුළදී අපගේ සේවාවන් කාර්යක්ෂමව සහ ඵලදායීව යෙදවීමට අඩිතාලම සකසා ගැනීමට හැකිවීම අප ලද භාග්‍යයක් කොට සලකමි.

මෙම නව නීතිය සම්බන්ධයෙන් දැනුවත් කිරීමේ වැඩසටහන් සිදු කිරීමට සහ ආයතනයේ යටිතල පහසුකම් සංවර්ධනය කිරීමට එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනෙන් ලබාදුන් මූල්‍යමය දායකත්වය සහ ආයතනයේ ව්‍යුහාත්මක වටපිටාව සකස් කිරීම මෙන්ම පවත්වාගෙන යාමට ඉවහල්වන රාජ්‍ය දායකත්වය සිහිපත් කරන්නේ ඉතා සතුටිනි.

අපගේ ආයතනය අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා පූර්ණ වශයෙන් දායක වන දකුණු නැගෙනහිර ආසියාවේ පවතින එකම ආයතනය වීම මෙන්ම අන්තර්ජාතිකව අපට ලැබී තිබෙන කීර්තිය ද අප ලද සුවිශේෂී ජයග්‍රහණයක් බව ඉමහත් සන්තෝෂයෙන් ප්‍රකාශ කරන අතර, එය අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම වෙනුවෙන් දකුණු ආසියාවේ පවතින හොඳම ආයතනය බවට පත්කිරීම මාගේ ඒකායන අරමුණයි.

අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් සුරකින ශ්‍රී ලංකාවක් බිහිකරනු වස් අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරිය යන ගමන් මග තුළ පෙළගැසී සිටි කළමනාකරණ මණ්ඩලය, අධ්‍යක්ෂ ජනරාල් ඇතුළු ආයතනික කාර්යය මණ්ඩලය ඉතා ගෞරවයෙන් සිහිපත් කරන අතරම 2019 වාර්ෂික වාර්තාව සඳහා මෙම පණිවිඩය ගෙන ඒමට ලැබීම ඉමහත් සතුටකි.

සුහද කේ. ගමලත්
සභාපති

## අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවුඩය



අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරියේ වාර්ෂික වාර්තාව සඳහා මෙම කෙටි පණිවිඩය මා ගෙන එන්නේ ඉමහත් සංතෘප්තියෙනි. 2019 වර්ෂයේදී අධිකාරියේ ප්‍රධාන අරමුණු සාක්ෂාත් කර ගැනීම සිහිගැන්වීම සඳහා මෙය විශේෂ අවස්ථාවක් කර ගනිමි.

2015 අංක 04 දරන අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනත බලගන්වමින් අපරාධයක වින්දිතයන් සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරිය 2016 මැයි මස 18 වන දින ආරම්භ කිරීමෙන් අනතුරුව ගතවූ කෙටි කාලය තුළදී සැලකිය යුතු ප්‍රගතියක් අත්පත් කරගෙන ඇති බව කිව යුතුය. 2018 වර්ෂයේදී 31ක් වූ අධිකාරියේ කාර්ය මණ්ඩල සාමාජිකයන් සංඛ්‍යාව 2019 වර්ෂය වන විට 38ක් දක්වා වර්ධනය කර ගැනීමට හැකි වූ අතර නීති නිලධාරීන් දෙදෙනෙකු, අභ්‍යන්තර විගණන නිලධාරීන් එක් අයෙකු, විමර්ශන නිලධාරීන් පස් දෙනෙකු තොරතුරු නිලධාරීන් එක් අයෙකු සහ භාෂා පරිවර්තක තනතුරට එක් අයෙකු වශයෙන් බඳවා ගන්න ලදී. අධිකාරියේ අරමුණු සාක්ෂාත් කර ගැනීමේ කාර්යය සඳහා එය ඉවහල් වී ඇත.

2017 සහ 2018 වර්ෂවලදී අධිකාරියට ලැබුණු පැමිණිලි සංඛ්‍යාව පිළිවෙළින් 49ක් සහ 86ක් වූ අතර 2019 වර්ෂයේදී ලැබූ පැමිණිලි සංඛ්‍යාව 252ක් දක්වා වර්ධනය වී ඇත. එය 2018 වර්ෂය සමඟ සංසන්දනය කිරීමේදී තුන් ගුණයක වර්ධනයකි. අප අධිකාරිය මගින් දිවයිනේ සෑම පළාතක්ම ආවරණය වන පරිදි ගෙන ගිය ප්‍රචාරණ වැඩසටහන් වල සාර්ථකත්වය මෙමගින් ප්‍රතීයමාන වේ. එලෙසම, 1985 මගින් අධිකාරිය ක්ෂණිකව සම්බන්ධ කරගත හැකි දුරකතන අංකය හඳුන්වාදීම සහ ප්‍රවර්ධනය කිරීම තුලින් 2019 වසර තුල ඇමතුම් 1,330ක **සංඛ්‍යාවක්** ලැබීම සැලකියයුතු කරුණකි.

2018 වර්ෂයේදී එක්සත් ජාතීන්ගේ සංවර්ධන අරමුදල (UNDP) මගින් ලද රුපියල් මිලියන 40ක ප්‍රදානයෙන් ඉතිරි මිලියන 13.2ක මුදල අප ආයතනයට අදාල වූ නීතිය සවිබල ගැන්වීමේ ක්‍රියාවලියට ඍජුවම දායක වන පාර්ශවයන් සඳහා වැඩසටහන් 13ක් ක්‍රියාත්මක කිරීමටත්, දිවයිනේ විවිධ ප්‍රදේශ ආවරණය කරමින් මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම උදෙසාත් යොදා ගැනුණි.

එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල (Unicef), එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP), ජාතික ළමා ආරක්ෂක අධිකාරිය, ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් (Transparency International)ආයතනය, නීතිපති දෙපාර්තමේන්තුව, අධ්‍යාපන අමාත්‍යාංශය, පොලිස් දෙපාර්තමේන්තුව වැනි දේශීය හා විදේශීය ආයතන සමඟ එක්ව කටයුතු කිරීම මගින් අප අධිකාරියට සිය අභිමතාර්ථ සඵල කර ගැනීමට හැකි වීමද අගයකොට සලකමි.

අපරාධවලට ලක් වූවන් සහ සාක්ෂිකරුවන් හට නොබියව සිය අයිතිවාසිකම් ආරක්ෂා කර ගනිමින්, නීතියේ ආධිපත්‍යය තහවරු වන පරිදි සිය සමාජ වගකීම ඉටු කිරීම සඳහා අවශ්‍ය ආරක්ෂාව සහ සහය ලබා දීම මගින් ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක සාධාරණීය ගුණාංග ප්‍රවර්ධනය අධිකාරියේ අනාගත අපේක්ෂාව වන අතර ඒ සඳහා උපරිම දායකත්වය දැක්වීමට අප කැප වන බවද මෙහි ලා විශේෂයෙන් සඳහන් කරමු.

උදයකුමාර අමරසිංහ
අධ්‍යක්ෂ ජනරාල්

## ✓ <u>දැක්ම</u>

**අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් සුරකින ශ්‍රී ලංකාවක්**

## ✓ <u>මෙහෙවර</u>

**අපරාධයක වින්දිතයන්ගේ හා සාක්ෂිකරුවන්ගේ අයිතිවාසිකම් හා හිමිකම් සුරක්ෂිත කිරීම හා ප්‍රවර්ධනය කිරීම, බලාත්මක කිරීම හා ක්‍රියාත්මක කිරීම**

# විධායක සාරාංශය

2015 අංක 04 දරන අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනත බලගන්වමින් 2016 සිට අපරාධයක වින්දිතයන් සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරිය බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ, අංක 428/11 ඒ දරන ස්ථානයෙහි පළමු මහලෙහි ස්ථාපිත කර ඇත.අධිකාරියේ කලමනාකරණ මණ්ඩලය, නිල බලයෙන් පත්වන සාමාජිකයන් (7) දෙනෙකුගෙන්ද, අතිගරු ජනාධිපතිවරයා විසින් තෝරා පත් කරනු ලබන සාමාජිකයන් පස් දෙනෙකුගෙන් සමන්විත වේ.අතිගරු ජනාධිපති තුමා විසින් ජනාධිපති නීතිඥ සුහද කේ. ගමලත් මහතා අධිකාරියේ සභාපතිවරයා ලෙස පත් කරන ලදී. අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ පනතෙහි අරමුණු පනතෙහි (2) වගන්තියේද, අපරාධයක වින්දිතයෙකු සතු අයිතිවාසිකම් පනතෙහි (3) වගන්තියේද , අපරාධයක වින්දිතයෙකු සතු හිමිකම් පනතෙහි (4) වගන්තියෙහිද , සාක්ෂිකරුවකු සතු හිමිකම් පනතෙහි (5) වගන්තියෙහිද , තොරතුරු සපයන්නන් සතු හිමිකම් පනතෙහි (6) වගන්තියෙහිද අධිකාරියේ කාර්යය සහ කර්තව්‍යය පනතෙහි (13) වගන්තියෙහිද සඳහන් කර ඇති අතර ඒවා පැහැදිලිවම මෙම වාර්තාවට ඇතුලත් කර ඇත.

අධිකාරියට අනුමත 54ක කාර්ය මණ්ඩලයෙන් 2018 වන විට නිලධාරීන් 31 දෙනෙකු බඳවාගෙන සිටි අතර 2019 වන විට එය 38ක් දක්වා වැඩිකර ගත් අතර එහිදී නීති නිලධාරීන් දෙදෙනෙක්, අභ්‍යන්තර විගණන නිලධාරීන් එක් අයෙක්, විමර්ශන නිලධාරීන් පස් දෙනෙක් තොරතුරු නිලධාරීන් එක් අයෙක් සහ භාෂා පරිවර්තක තනතුරට එක් අයෙක් වශයෙන් බඳවා ගන්න ලදී. 2019 වසරේ කළමනාකරණ මණ්ඩල රැස්වීම් 20ක් පැවැත්වීමට කටයුතු කරන ලදී.

2019 වර්ෂය තුළ අධිකාරිය වෙත ලැබුණු පැමිණිලි ගණන 252ක් වන අතර, එය 2018 වසර සමඟ සංසන්දනාත්මකව බලන කල එය තුන් ගුණයක වර්ධනයකි. එම පැමිණිලි 252න් අවසන් කරන ලද පැමිණිලි ගනන 61කි. මෙහිදී අධිකරණය වෙතින් යොමු කරන ලද ඉල්ලීම් සම්බන්ධයෙන් විශේෂ අවධානයක් දක්වන ලදී. වෙනත් ආයතන වලට යොමු කරන ලද පැමිණිලි ගණන 05කි. එමෙන්ම එම කාලය තුළ ආරක්ෂාව සැලසූ පැමිණිලි ගණන 14 ක්ද විමර්ශනය වෙමින් පවතින පැමිණිලි ගණන 166ක්ද බහාලන ලද පැමිණිලි ගණන 03 ක්ද වේ. 2015 අංක 4 දරන අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනතේ 24 (1) වගන්තිය යටතේ අධිකරණ සහ කොමිෂන් සභා වෙතින් නියෝග 11 ක් අධිකාරිය වෙත ලැබුණු අතර එකී සෑම නියෝගයක් සම්බන්ධයෙන්ම ආරක්ෂාව ලබා දීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලදි. තවද පනතේ 29 වගන්තිය ප්‍රකාරව අධිකාරියේ ආරක්ෂණ අරමුදල ස්ථාපිත කර ඇති අතර 2019 දෙසැම්බර් 31 වන විට එය මිලියන 3.9ක් දක්වා වර්ධනය වී ඇත. පනතේ 4(1) වගන්තිය ප්‍රකාරව අධිකරණ හෝ අර්ධ අධිකරණ කටයුත්තකට සහභාගී වීම සඳහා අධිකරණය වෙත යාමේදී අහාර, නවාතැන් සහ ප්‍රවාහනය වෙනුවෙන් වැය වන වියදම් අධිකාරියේ ආරක්ෂණ අරමුදලෙන් ගෙවන ලෙස අධිකරණයෙන් ඉල්ලීමක් ලද විට උපරිමය රුපියල් පන්දහසකට යටත්ව එම වියදම් ගෙවීමට 2019.11.15 වන දින පැවති අධිකාරියේ කළමණාකරණ මණ්ඩල රැස්වීමේදී තීරණය කරන ලදී. එවැනි ඉල්ලම් දෙකක් 2019 වර්ෂයේ ඉදිරිපත් වූ අතර එක් ඉල්ලීමක් සම්බන්ධයෙන් මෙම වර්ෂයේදීම මුදල් ලබා දීම සිදු කෙරුණි.

2019 මාර්තු මස සිට අධිකාරිය ක්ෂණිකව සම්බන්ධ කරගත හැකි දුරකතන අංකය ලෙස 1985 විදුලි සංදේශ නියාමන කොමිසම මගින් ලබාගත් අතර ඒ සඳහා 2019 වසර තුල ලැබුණු ඇමතුම් සංඛ්‍යාව 1,330 වේ.

2018 වර්ෂයේදී එක්සත් ජාතීන්ගේ සංවර්ධන අරමුදල (UNDP) මගින් රුපියල් මිලියන 40ක ප්‍රදානයක් ලද අතර එයින් ඉතිරිව තිබූ රුපියල් මිලියන 13.2ක මුදල ආයතනයේ අරමුණු සාක්ෂාත් කර ගැනීමට යොදවා ගත් අතර එහිදි ප්‍රධාන වශයෙන්ම ජාතික අධිකාරියේ නිලධාරීන් සහ සහායක සහ ආරක්ෂක කොට්ඨාසයේ නිලධාරීන් තාක්ෂණික දැනුම

වැඩිදියුණු වීම සඳහා පුහුණු කිරීම මෙන්ම ළමා ආරක්ෂක නිලධාරීන්, පොලිස් විශේෂ විමර්ශන ඒකකය නිලධාරීන්, ශ්‍රී ලංකා නීතිඥ සංගමය (යාපනය) නීතිඥවරුන්, නීතිපති දෙපාර්තමේන්තුවේ රජයේ අධිනීතිඥවරුන්, නීතිඥ සංගමයේ නීතිඥවරුන්, සිවිල් සංවිධාන ආයතන නිලධාරීන්, අධ්‍යාපන අමාත්‍යාංශයේ කළාප අධ්‍යාපන නිලධාරීන්, හම්බන්තොට සහ ගාල්ල දිස්ත්‍රික් රාජ්‍ය නිලධාරීන්, අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරියට සහ සහායක සහ ආරක්ෂක කොට්ඨාසයට අළුතින් බඳවා ගත් නිලධාරීන් දැනුවත් කිරිමේ සහ සංවේදී කිරිමේ වැඩසටහන් 2019 වසරේදි සිදු කරන ලද අතර එම පාර්ශවයන් සමඟ වැඩමුළු 13ක් පමණ පවත්වන ලදි. එලෙසම, එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනේ (UNDP) ඍජු ආධාර මත ජාතික අධිකාරිය පරිවාස හා ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරීන්, බස්නාහිර පළාත් අපරාධ හා සුළු අපරාධ ස්ථානාධිපතිවරුන්, සහ බස්නාහිර පළාත් කාන්තා හා ළමා ආරක්ෂක නිලධාරිනියන් සඳහා පුහුණු වැඩසටහන් සංවිධානය කර පවත්වන ලදී. මීට අමතරව එක්සත් ජාතීන්ගේ ළමා අරමුදලේ (Unicef) මඟින් ඍජුවම ආධාර ලබා දී අධිකාරියේ සංවිධානය කරන ලද වැඩමුළුවක් ළමා වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා අධිකාරියේ තාක්ෂණික අංශවල නිලධාරීන් සහ ඉහල පොලිස් නිලධාරීන්ගේ සහභාගිත්වයෙන් පවත්වන ලදී. මෙමගින් අප ආයතනයට අදාළ වූ නීතිය සවිබල ගැන්වීමේ ක්‍රියාවලියට ඍජුවම දායක වන පාර්ශවයන් සඳහා විශේෂිත වූ දේශනමාලා රාශියක් අප ආයතනයේම කළමනාකරණ මණ්ඩලයේ විද්වතුන් විසින් ඔවුන්ට ලබා දෙන ලදි. එම සියලුම වැඩසටහන් වලදි අප අධිකාරියේ තාක්ෂණික කාර්යයන් ඇතුළත් අත්පත්‍රිකා සහ සරල සංක්ෂිප්ත පත්‍රිකා සහ ට්‍රාන්ස්පේරන්සි ඉන්ටර්නැෂනල් (Transparency International) ආයතනයෙන් ලබා දුන් අත්පොත බෙදා දෙන ලදී. එමෙන්ම අප ආයතනය මගින් සැකසූ පෝස්ටර් දිවයිනේ සියලුම දිස්ත්‍රික්ක ලේකම්වරු (25) හා ප්‍රාදේශීය ලේකම්වරු (331) වෙත සහ ජාතික පාසල් (353) කාර්යාල පරිශ්‍රයන්හි දැන්වීම පුවරු මත ප්‍රදර්ශනයට සඳහා බෙදාහරින ලදී.

ළමා අපයෝජන බහුල වශයෙන් සිදු වීමේ අවධානමක් සහිත උතුරුමැද පළාතේ ගලෙන්බිඳුණුවැව අධ්‍යාපන කොට්ඨාසයේ තම්මැන්නාව වේළුසුමන මහා විද්‍යාලයේ පැවති ප්‍රදර්ශනයට සමගාමීව පාසල් සිසුන් 10,000ක් දෙමාපියන් 1,000ක් ගුරුවරු 600ක් දැනුවත් කිරිමේ වැඩසටහන් ක්‍රියාත්මක කළ අතර දිවයිනේ අධිකරණ පරිශ්‍රයන් 205ක දැන්වීම් පුවරුමත ප්‍රදර්ශනය කිරිම උදෙසා පෝස්ටර් 820ක් ලබා දෙන ලදි.

අප ආයතනය ආරම්භකොට මූලික අවධියේ පවතින බැවින් මහජනයා දැනුවත් කිරීමේ ව්‍යාපාරය දියත් කෙරිණි. පෝස්ටර් සහ වීඩියෝ සහ ගුවන්විදුලි ක්ලිප් නිෂ්පාදනය කර රූපවාහිනී / ගුවන් විදුලි නාලිකා වල මසක කාලයක් ප්‍රචාරය කිරීම සිදුවිය. මෙමගින් ආයතනයේ සේවාවන් පිළිබඳව මහජනයා දැනුවත්වීම සිදුකරන ලදී.

ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් (Transparency International) මගින් අපරාධ වින්දිතයන් හා සාක්ෂිකරුවන්ට සහය දීමේ ආරක්ෂා කිරීමේ පනතේ සඳහන් වින්දිතයන්ගේ සහ සාක්ෂිකරුවගේ අයිතිවාසිකම් හා හිමිකම් මෙන්ම ආයතනයෙන් ලබාදෙන සේවාවන් අන්තර්ගත කරමින් මුද්‍රණය කරන ලද පෝස්ටර් 1,000ක් 2019 වර්ෂයේ සපයන ලදී.

# හැඳින්වීම

අපරාධයක වින්දිතයන් හා සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා විධිමත් නෛතික රාමුවක් සහ වැඩපිළිවෙළක් හඳුන්වා දීම මගින් අපරාධ යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලිය සවිබල ගැන්වීම සඳහා පාර්ලිමේන්තුව විසින් ඒකමතිකව සම්මත කරන ලද 2015 අංක 04 දරන අපරාධයක වින්දිතයන් හා සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනත යටතේ, අපරාධයක වින්දිතයන් හා සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරිය පිහිටුවා ඇත. බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ, අංක 428/11ඒ දරන ස්ථානයෙහි පළමු මහලෙහි වර්ග අඩි 2800ක පමණ භූමි ප්‍රමාණයකින් යුක්ත ගොඩනැගිල්ලක් තුල මෙම ආයතනය පිහිටුවා ඇති අතර, අතිගරු ජනාධිපතිතුමා විසින් 2016.01.08 වන දින අධිකාරිය උත්සවාකාරයෙන් විවෘත කරන ලදි. පසුව අංක 1966/02 හා 2016.05.09 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නිවේදනය මඟින් උක්ත අධිකාරිය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 43(2) ව්‍යවස්ථාව යටතේ 2016.04.27 දින සිට ක්‍රියාත්මක වන පරිදි ගරු අධිකරණ අමාත්‍යවරයා යටතට පවරා ඇත. ඒ අනුව අධිකරණ අමාත්‍යවරයා විසින් අංක 1967/08 හා 2016.05.16 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නිවේදනය මඟින් 2015 අංක 04 දරන අපරාධයක වින්දිතයන් හා සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීම පනතෙහි සියලු කොටස් 2016.05.18 දින සිට ක්‍රියාත්මක කොට ඇත.

පනතෙහි 12(ආ) වගන්තිය ප්‍රකාරව අතිගරු ජනාධිපතිතුමා විසින් 2016.08.11 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි අධිකාරියේ කළමනාකරණ මණ්ඩලය පත්කර ඇති අතර එය අධිකරණ අමාත්‍යාංශයේ ලේකම්, පොලිස් දෙපාර්තමේන්තුව භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්, කාන්තා කටයුතු විෂය හා ළමා කටයුතු විෂය භාර අමාත්‍යවරුන්ගේ අමාත්‍යාංශවල ලේකම්වරු හෝ ඔවුන්ගේ නියෝජිතයින්ගෙන් හා මානව හිමිකම් කොමිෂන් සභාවේ සමාජිකයකු, නීතිපතිවරයාගේ නියෝජිතයකු සහ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති ධූරය දරන පොලිස්පතිවරයාගේ නියෝජිතයකු ඇතුළත්වන නිල බලයෙන් පත්වන සාමාජිකයන් හත් (7) දෙනකුගෙන්ද අපරාධවේදය, අපරාධ යුක්ති පද්ධතිය, මානව හිමිකම් ප්‍රවර්ධනය හා ආරක්ෂා කිරීම හෝ වෛද්‍ය විද්‍යාව ආශ්‍රිත හෝ ඒ හා සම්බන්ධිත වෘත්තීන්හි අධ්‍යාපනික හෝ වෘත්තිමය සුදුසුකම් ලත් සහ පළපුරුද්දක් ඇති තැනැත්තන් අතරින් ජනාධිපතිවරයා විසින් තෝරා පත් කරනු ලබන සාමාජිකයින් පස් දෙනෙකුගෙන් ද සමන්විත වේ. අතිගරු ජනාධිපතිතුමා විසින්, මණ්ඩලයේ පත් කළ සාමාජිකයකු වන සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ සුහද කේ. ගමලත් මහතා 2016 අගෝස්තු මස 11 වන දින සිට අධිකාරියේ සභාපතිවරයා ලෙස පත් කරන ලදී.

**අපරාධයක වින්දිතයන් හා සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ පනතෙහි අරමුණු පහත පරිදි වේ.**

<u>(පනතෙහි (2) වගන්තිය)</u>

1. අපරාධයක වින්දිතයන්ගේ සහ සාක්ෂිකරුවන්ගේ අයිතිවාසිකම් සහ හිමිකම් දැක්වීම, ස්ථිර කිරීම සහ ක්‍රියාත්මක කිරීම සහ එම අයිතිවාසිකම් සහ හිමිකම් ප්‍රවර්ධනය කිරීම, ආරක්ෂා කිරීම, බලාත්මක කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා යාන්ත්‍රණයක් සැලසීම.
2. අපරාධයක වින්දිතයන්ට සහ සාක්ෂිකරුවන්ට සහාය සහ ආරක්ෂාව ලබාදීම.
3. අපරාධයක වින්දිතයන්ට එරෙහිව වරදක් සිදුකිරීම නිසා වරදකරු වූ තැනැත්තන්ගෙන් වින්දිතයන් හට වන්දි මුදල් ලබාගැනීමට සැලැස්වීම.
4. ප්‍රතිෂ්ඨාපනය, වන්දි, හානිපූරණය සහ පුනරුත්ථාපනය ඇතුළුව , අපරාධයක වින්දිතයන් හට සහන ලබාගැනීම සඳහා විධිවිධාන සැලැස්වීම.
5. අපරාධයක වින්දිතයන්ගේ සහ සාක්ෂිකරුවන්ගේ අයිතිවාසිකම් සහ හිමිකම් වර්ධනය කිරීම හා වැඩිදියුණු කිරීම උදෙසා වූ, රජයේ අධිකරණ නිලධරයන්ගේ සහ රජයේ නිලධරයන්ගේ කාර්යය සහ වගකීම දැක්වීම.
6. අපරාධයක වින්දිතයන්ට සහ සාක්ෂිකරුවන්ට එරෙහිව සිදුකළ හැකි වැරදි සඳහන් කිරීම සහ ඒ වැරදි සිදු කරන තැනැත්තන් උදෙසා පැනවිය හැකි දණ්ඩන නියම කිරීම.
7. අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීමට අදාළව යහපත් ප්‍රතිපත්ති පිළිගැනීම සහ ක්‍රියාත්මක කිරීම.

## අපරාධයක වින්දිතයන්ගේ සහ සාක්ෂිකරුවන්ගේ අයිතිවාසිකම් සහ හිමිකම්

**අපරාධයක වින්දිතයකු සතු අයිතිවාසිකම් (පනතෙහි (3)වගන්තිය)**

1. සමාන ව සාධාරණ ව වින්දිතයාගේ ගරුත්වයට සහ පෞද්ගලිකත්වයට සලකවාගනු ලැබීමට (3 (1) (අ) වගන්තිය)
2. ළමා වින්දිතයෙකු වන විටෙක ඔහුගේ උපරිම යහපත තහවුරු වන ලෙස සලකවාගනු ලැබීමට (3 (1) (ආ) වගන්තිය)
3. වින්දිතයකු වීම නිසා යම් අලාභයක් සිදු වුණි නම්, ඒ සඳහා අප්‍රමාද ව සුදුසු සහනයක් ලබා ගැනීමට(3 (1) (ඇ) වගන්තිය)
4. මානසික හෝ කායික හිංසාවක් සිදු වුණි නම් ඒ සඳහා වෛද්‍ය ප්‍රතිකාර ලබා ගැනීමට (3 (1) (ඉ) වගන්තිය)
5. තර්ජන හා බියගැන්වීම්වලින් නිසි ආකාරයෙන් ආරක්ෂා වීමට (3 (1) (ඈ) වගන්තිය)
6. වින්දිතයා ඉල්ලීමක් කර ඇති විටදී, අධිකාරිය මගින් හෝ කොට්ඨාසය මගින් නීතිමය තත්වයන් පිළිබඳව දැනුවත් වීමට, පැමිණිල්ලේ විමර්ශනය පිළිබඳ දැනුවත් වීමට, අධිකරණ කටයුතුවල ප්‍රගතිය පිළිබඳව දැනුවත් වීමට අවශ්‍ය වෛද්‍ය, සමාජ සේවා සහ අනෙකුත් සේවාවන් පිළිබඳව දැනුවත් වීමට(3 (1) (ඊ) වගන්තිය)
7. පොලිස් නිලධාරියෙකු ලවා පැමිණිල්ලක් වාර්තාගත කර ගැනීමට සහ එම පැමිණිල්ල පූර්ණ ලෙස විමර්ශනය කරවා ගැනීමට(3 (1) (උ) වගන්තිය)
8. වරදකට අදාළ ව විවිධ විමර්ශනයන් සිදු කෙරෙන කාලසීමාවේදී අදාළ නීතිය ක්‍රියාත්මක කරන නිලධාරියෙකු වෙතට නීතිඥයෙකු මගින් පෙනී සිට කරුණු ඉදිරිපත් කිරීමට (3 (1) (ඌ) වගන්තිය)
9. පොලීසිය මගින් මහේස්ත්‍රාත් අධිකරණය වෙත ගොනු කළ යුතු වාර්තාවල සහතික පිටපත් ලබා ගැනීමට(3 (1) (එ) වගන්තිය)
10. වින්දිතයාට එරෙහි ව කර ඇති වරදකට අදාළ ව නඩු කටයුත්තක් පවත්වා ගෙන යාමට පෙර සහ එය පවත්වා ගෙන යන කාලසීමාව තුළ නීතිපතිවරයා වෙත කරුණු ඉදිරිපත් කිරීම පිණිස නීතිඥයෙකු මාර්ගයෙන් ලිපි යැවීමට හෝ නියෝජනයන් සිදු කිරීමට (3 (1) (ඒ) වගන්තිය)
11. අදාළ වරද සම්බන්ධයෙන් විමර්ශන පවත්වන විමර්ශකයෙකු වෙත ලිපි යැවීමට හෝ නියෝජනයන් සිදු කිරීමට සහ එම නියෝජනයන්ට ප්‍රතිචාරයන් ලබා ගැනීමට (3 (1) (ඔ) වගන්තිය)
12. වරද සිදු කරනු ලැබූ තැනැත්තා වරදකරු කිරීමෙන් පසු එය දඬුවම තීරණය කිරීමට පෙර, එම වරද වින්දිතයාගේ ජීවිතයට බලපෑ ආකාරය පිළිබඳව පුද්ගලිකව හෝ නීතිඥයෙකු මාර්ගයෙන් අධිකරණයට දැන්වීමට (3 (1) (ඕ) වගන්තිය)
13. වරදකරු අභියාචනයක් හෝ ප්‍රතිශෝධනයක් ඉදිරිපත් කර තිබෙන විට එම වරද වින්දිතයාගේ ජීවිතයට බලපෑ ආකාරය පිළිබඳ ව පුද්ගලික ව හෝ නීතිඥයෙකු මාර්ගයෙන් අධිකරණයට කරුණු දැන්වීමට (3 (1) (ඡ) වගන්තිය)
14. වරද සිදු කරනු ලැබූ තැනැත්තාට සමාවක් දීම සලකා බැලීමක දී හෝ දඬුවමක් ලිහිල් කිරීම සලකා බැලීමක දී ඒ පිළිබඳව දැන්වීමක් ලැබීමට සහ එම වරද වින්දිතයාගේ ජීවිතයට බල පෑ ආකාරය පිළිබඳ ව පුද්ගලිකව හෝ නිතිඥයෙකු මාර්ගයෙන් හෝ අදාළ අධිකාරියට දැන්වීමට (3 (1) (ට) වගන්තිය)

**අපරාධයක වින්දිතයකු සතු හිමිකම් (පනතෙහි (4) වගන්තිය)**

1. යම්කිසි අධිකරණ කටයුත්තකට සහභාගි වීම නිසා, අපරාධයක වින්දිතයකුට දරන්නට සිදු වූ වියදම් වෙනුවෙන් අධිකාරියෙන් කිසියම් මුදලක් ලබා ගැනීමට(4 (1) වගන්තිය)
2. අපරාධයක වින්දිතයකු වීම නිසා අත්විඳි කායික හෝ මානසික හිංසාවන් සඳහා සුදුසු වෛද්‍ය ප්‍රතිකාර, උපදේශන සේවා රජයෙන් ඉල්ලා සිටීම (4 (2) වගන්තිය)
3. රජයට වෛද්‍ය ප්‍රතාකාර හෝ උපදේශන සේවා ලබා නොදිය හැකි අවස්ථාවක දී එකී අවශ්‍යතා පෞද්ගලික අංශයෙන් ලබා ගැනීම සඳහා අධිකාරියට ඉල්ලීමක් කිරීමට (4 (3) වගන්තිය)

**සාක්ෂිකරුවෙකු සතු හිමිකම් (පනතෙහි (5) වගන්තිය)**

1. සාක්ෂිකරුවන්ගේ ගෞරවයට සහ පුද්ගලිකත්වයට සාධාරණයක් වන සේ සහ ගෞරවයෙන් සලකවා ගනු ලැබීමට(5 (1) වගන්තිය)
2. මූලික අයිතිවාසිකමක් කඩ කිරීමටකට අදාළ ව තොරතුරු සැපයීම, යම් වරදක් පිළිබඳ ව විමර්ශනයක් පවත්වන අතරතුරදී ස්වේච්ඡාවෙන් ප්‍රකාශනයක් කිරීම හෝ යම්කිසි වරදක් සිදු කිරීමකට හෝ මූලික අයිතිවාසිකම් කඩ කිරීමකට අදාළ ව අධිකරණයක දී සාක්ෂි ලබා දීමේ දී සාක්ෂිකරු කිසිදු හිරිහැරයකට ලක් නොවී සිටීමේ හිමිකම. එවැන්නකට එරෙහි ව ආරක්ෂාව ලබා ගැනීමට සාක්ෂිකරුවෙකුට හිමිකමක් ඇත.(5 (1) වගන්තිය)

**තොරතුරු සපයන්නන් සතු හිමිකම් (පනතෙහි (6) වගන්තිය)**

සාක්ෂිකරුවකු වන හෝ නොවන හෝ යම්කිසි පුද්ගලයෙකු තමාගේ සේවා ස්ථානයේ වන වරදක් හෝ මූලික අයිතිවාසිකමක් කඩ කිරීමකට අදාළ ව තොරතුරු සැපයීම, ඒ පිළිබඳ ව පැමිණිල්ලක් ඉදිරිපත් කිරීම හෝ ඊට අදාළ ව අධිකරණයක දී සාක්ෂි ලබා දීම හේතු කොට ගෙන එකී පුද්ගලයාට කිසිදු හිරිහැරයක් හෝ රැකියාවේ අහිතකර වෙනසකට එරෙහි ව ආරක්ෂාව ලබා ගැනීමට හිමිකමක් ඇත.(6 වන වගන්තිය)

## අධිකාරියේ කාර්යය සහ කර්තව්‍ය

### (පනතෙහි (13) වගන්තිය)

1. අපරාධයක වින්දිතයන්ගේ අයිතිවාසිකම් සහ හිමිකම් හඳුනා ගැනීම සහ ඒවාට ගෞරවය කිරීම ප්‍රවර්ධනය කිරීම.
2. සාක්ෂිකරුවන්ගේ හිමිකම් හඳුනා ගැනීම සහ ඒවාට ගෞරව කිරීම ප්‍රවර්ධනය කිරීම.
3. අපරාධයක වින්දිතයන්ගේ අයිතිවාසිකම් හා සාක්ෂිකරුවන්ගේ හිමිකම් ආරක්ෂා කිරීම හෝ ආරක්ෂා කිරීමට සැලැස්වීම.
4. අපරාධයක වින්දිතයකුගේ හෝ සාක්ෂිකරුවකුගේ යම් අයිතිවාසිකමක් හෝ හිමිකමක් කඩ කරන ලදැයි යන්න පිළිබඳ ව ලැබුණු පැමිණිල්ලක් හෝ යම් තොරතුරු මත, මේ පනත යටතේ අපරාධයක වින්දිතයන්ගේ සහ සාක්ෂිකරුවන්ගේ අයිතිවාසිකම් සහ හිමිකම් හඳුනා ගැනීම, ආරක්ෂා කිරීම සහ ප්‍රවර්ධනය කිරීම සහතික කිරීම උදෙසා, කරන ලදැයි කියන කඩ කිරීම පිළිබඳ ව විමර්ශනය කර ඒ සම්බන්ධයෙන් සුදුසු නිවැරදි කිරීමේ ක්‍රියා මාර්ග ගැනීමට අදාළ අධිකාරීන්ගෙන් ඉල්ලා සිටීම.
5. අපරාධයක වින්දිතයන්ට සහ සාක්ෂිකරුවන්ට අවශ්‍ය ප්‍රතිකාර, හානිපූරණය, ප්‍රතිෂ්ඨාපනය සහ පුනරුත්ථාපන පියවර ගැනීම ඇතුළු ව අවශ්‍ය සහාය සැපයීම.
6. අපරාධයක වින්දිතයන් හට මේ පනතේ 29 වන වගන්තිය මගින් පිහිටුවන ලද අපරාධයක වින්දිතයන්ගේ හා සාක්ෂිකරුවන්ගේ අරමුදලෙන් වන්දි ප්‍රදානය කිරීම සඳහා යෝජනා ක්‍රමයක් සකස් කර එය පිළිගැනීම සහ ක්‍රියාත්මක කිරීම.
7. මේ පනත මගින් සලසා ඇති අපරාධයක වින්දිතයන්ගේ සහ සාක්ෂිකරුවන්ගේ අයිතිවාසිකම් සහ හිමිකම් පිළිබඳ ව මහජනයා දැනුවත් කිරීම.
8. විශේෂයෙන් ම අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට -
   i. ඵලදායී ආරක්ෂාව
   ii. අවශ්‍ය ප්‍රතිකාර, පුනරුත්ථාපනය සහ උපදේශනය
   සහ
   iii. වෙනත් සුදුසු සහායයන් සැපයීම ඇතුළු ව,

   අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට මෙම පනතින් සලසා ඇති අයිතිවාසිකම් සහ හිමිකම්වලට බලාත්මක භාවයක් ලබා දීම පිණිස යොදා ගත යුතු, පිළිගත යුතු හෝ ක්‍රියාත්මක කළ යුතු සුදුසු සහ විශේෂිත පියවර පිළිබඳ සාමාන්‍යයෙන් හෝ එක් එක් අවස්ථාවන් වෙන් වෙන් ව සලකා බැලීමේ පදනම මත, ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුවට සහ වෙනත් යම් රජයේ දෙපාර්තමේන්තුවකට, ව්‍යවස්ථාපිත ආයතනයකට සහ රජයේ නිලධරයන්ට, උපදෙස් දීම සහ නිර්දේශ කිරීම.

9. විවිධ අධිකාරීන් විසින් පිළිගත් සහ අනුගමනය කරන, දැනට පවතින ප්‍රතිපත්ති, නීති සහ ක්‍රියාමාර්ග සහ ක්‍රියාපටිපාටි අපරාධයක වින්දිතයන්ගේ සහ සාක්ෂිකරුවන්ගේ අයිතිවාසිකම් සහ හිමිකම් ප්‍රවර්ධනය සහ ආරක්ෂා කිරීමට අදාළව පිළිගත් සම්මතයන්ට සහ යහපත් පරිචයන්ට අනුකූල බව තහවුරු කර ගැනීම උදෙසා

ඒවා සමාලෝචනය කිරීම හා එම සමාලෝචනයන් පදනම් කර ගනිමින් සුදුසු ප්‍රතිපත්ති, නීති සහ ක්‍රියා මාර්ග පිළිගැනීම, සංශෝධනය කිරීම සහ යොදා ගැනීම පිළිබඳ ව නිර්දේශ කිරීම.

10. යම් අධිකරණයක් හෝ කොමිෂන් සභාවක් හෝ වෙන යම් තැනැත්තකුගේ ඉල්ලීම මත, සමකාලීන හෝ ආසන්න සමකාලීන ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බන්ධකයක් මගින් සාක්ෂි ලබා ගැනීමේ පිළිගත් ප්‍රතිමාන සහ යහපත් පරිචයන් පිළිබඳ ව තොරතුරු ලබා දීමට සැලැස්වීම.

11. අපරාධයක වින්දිතයන්ගේ සහ සාක්ෂිකරුවන්ගේ වයස, ස්ත්‍රී පුරුෂ භාවය, ආගම, භාෂාව, සංස්කෘතික විශ්වාසයන් සහ පුරුදු, ජන වාර්ගික හෝ සමාජ ප්‍රභවයන් හෝ ආබාධිත බව හෝ වෙනත් යම් හේතු නිසා සිදු විය හැකි හානිවල ප්‍රතිඵලයන් ලෙස අපරාධයක වින්දිතයන්ට සහ සාක්ෂිකරුවන්ට පැන නගින අවශ්‍යතා සහ සුවිශේෂ කණ්ඩායම්වලට අයත් අපරාධයක වින්දිතයන්ට පැන නගින විශේෂ අවශ්‍යතා මත, ශ්‍රී ලංකා පොලිසියේ නිලධරයන්, බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ නිලධරයන්, රජයේ වෛද්‍ය නිලධරයන්, පරිවාස හා සමාජ සේවාවලට සම්බන්ධ රජයේ නිලධරයන් ඇතුළුව, නීතිය බලාත්මක කිරීමට සම්බන්ධ රජයේ නිලධරයන් සංවේදීකරණය කිරීමට පියවර ගැනීම.

12. ශ්‍රී ලංකා පොලිසියේ නිලධරයන්, බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ නිලධරයන්, රජයේ වෛද්‍ය නිලධරයන් සහ රජයේ සමාජ සේවා ආයතනවල නිලධරයන් ඇතුළු ව, නීතිය බලාත්මක කිරීමට අදාළ අධිකරණ, කොමිෂන් සභා, වෙනත් යම් විනිශ්චය සභා, රජයේ නිලධරයන් සහ ව්‍යවස්ථාපිත ආයතනවල සේවා නියුක්තිකයන් විසින්, අපරාධයක වින්දිතයන්ගේ අයිතිවාසිකම් සහ සාක්ෂිකරුවන්ගේ හිමිකම් ආරක්ෂා කිරීමට අදාළ පාලන සංග්‍රහයන් සහ පිළිගත් ප්‍රතිමාන සහ යහපත් පරිචයන් පිළිපැදීම සහ අදාළ කර ගැනීම ප්‍රවර්ධනය කිරීම සහ නිර්දේශ කිරීම.

13. (i) අපරාධ සිදුවීම අඩුකළ හැකි;

(ii) නිශ්චිත අපරාධවලින් වින්දිතයන් හට සිදුවන බලපෑම අවම කළ හැකි හෝ වැළැක්විය හැකි;

(iii) වින්දිතයන්ට ඵලදායි ලෙස ප්‍රතිකාර තළ හැකි, පුනරුප්ථාපනය කළ හැකි, උපදේශනය කළ හැකි, සහාය දිය හැකි, වන්දි ගෙවිය හැකි සහ ආරක්ෂා කළ හැකි;

(iv) නීතිය බලාත්මක කිරීමේ අධිකාරියක් ඉදිරිපිට හෝ අධිකරණයක් ඉදිරිපිට සහ වෙනත් කොමිෂන් සභාවක් ඉදිරිපිට සහ වෙනත් කොමිශන් සභාවක් ඉදිරිපිට සහ වෙනත් විනිශ්චය සභාවක් ඉදිරිපිට වූ නඩු කටයුත්තක දී, බියෙන් තොරව සාක්ෂිකරුවන් හට ප්‍රකාශයන් කිරීමට හෝ සාක්ෂි දීමට උපකාරී වන පරිසරයක් නිර්මාණය කළ හැකි;

(v) අපරාධයක වින්දිතයන්ට සහ සාක්ෂිකරුවන්ට සහාය සහ ආරක්ෂාව සැලසිය හැකි,

ක්‍රම සහ විධි පිළිබඳව පර්යේෂණ පැවැත්වීම හෝ එසේ පැවැත්වීම ප්‍රවර්ධනය කිරීම;

14. අපරාධ සිදුවීම් අඩුකිරීම සඳහා සහ අපරාධයක වින්දිතයන්ට සහ සාක්ෂිකරුවන්ට සහාය සහ ආරක්ෂාව පිළිබඳ පහසුකම් සැලස්වීම සඳහා අදාළ රජයේ ආයතනවලට ඒ ආයතන මගින් තෝරාගනු ලැබිය හැකි සමාජ, සෞඛ්‍ය, අධ්‍යාපනික, ආර්ථික සහ අපරාධ වැළැක්වීමේ ප්‍රතිපත්ති පිළිබඳව නිර්දේශ කිරීම;

15. අපරාධ යුක්ති පද්ධතිය තුළ දඬුවම් නියම කිරීමට විකල්පයක් වශයෙන් අපරාධයක වින්දිතයන් පෙර සිටි තත්ත්වයට ගැනීමේ පියවර වර්ධනය කිරීම, පිළිගැනීම සහ ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් නිර්දේශ කිරීම;
16. අපරාධ යුක්ති පරිපාලනය කිරීමේ ක්‍රමයක් ලෙස සහ අපරාධ යුක්ති පද්ධතිය තුළ දඬුවම් නියම කිරීමට විකල්පයක් වශයෙන්, පෙර තිබූ තත්ත්වයට පැමිණවීම සඳහා යුක්ති සහගත පියවර ගැනීම වර්ධනය කිරීම, පිළිගැනීම සහ ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් නිර්දේශ කිරීම;
17. අපරාධයක වින්දිතයන්ට සහ සාක්ෂිකරුවන්ට සහාය සැපයීම සඳහා යෝජනා ක්‍රමයක් වැඩිදියුණු කිරීම,යොදාගැනීම සහ ක්‍රියාත්මක කිරීම;
18. අපරාධයක වින්දිතයන්ගේ සහ සාක්ෂිකරුවන්ගේ සහායක සහ ආරක්ෂක කොට්ඨාසය පිහිටුවීම සහ පවත්වාගෙන යාම සඳහා අදාළ නියමු උපදේශන නිකුත් කිරීම;
19. (i) අධිකාරිය විසින් මේ පනතේ අරමුණුවලට බලාත්මක භාවයක් දී ඇති ආකාරය;

    (ii) අධිකාරියේ කාර්යය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම සහ ඉටු කිරීම; සහ

    (iii) අවශ්‍ය ප්‍රතිපත්තිමය සහ නීතිමය ප්‍රතිසංසකරණ,

    පිළිබඳ වාර්තාවක් වාර්ෂිකව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම;
20. මේ පනතේ පරමාර්ථ සාක්ෂාත් කර ගැනීමට අවශ්‍ය විය හැකි වැඩිදුරටත් වූ යම් කර්තව්‍ය හා කාර්යයයන් ඉටු කිරීම හෝ ක්‍රියාත්මක කිරීම.

**පනතේ 11 වගන්තිය යටතේ පිහිටුවනු ලැබූ මෙම ජාතික අධිකාරියේ බලතල හා කාර්යභාරය පහත සඳහන් පරිදි සංක්ෂිප්ත ව දැක්විය හැකි ය.**

- **බලාත්මක කිරීමේ කාර්යභාරය**

  අපරාධයක වින්දිතයන්ගේ සහ සාක්ෂිකරුවන්ගේ අයිතිවාසිකම් හා හිමිකම් හඳුනා ගැනීම, ගෞරව කිරීම, ප්‍රවර්ධනය කිරීම, ආරක්ෂා කිරීම හා දැනුවත් කිරීම.

- **අර්ධ අධිකරණමය කාර්යභාරය**

  අපරාධයක වින්දිතයන් හා සාක්ෂිකරුවන්ගේ අයිතිවාසිකම් හා හිමිකම් කඩවීම් පිළිබඳ පැමිණිලි විමර්ශනය කිරීම හා විභාග කිරීම, එම උල්ලංඝනයට අදාළ ව උචිත රාජ්‍ය නිලධාරීන්ට සහ රාජ්‍ය ආයතනවලට නියෝග නිකුත් කිරීම

- **සේවා කාර්යභාරය**

  අපරාධයක වින්දිතයන්ට හා සාක්ෂිකරුවන්ට ආරක්ෂාව සහ සහාය සැලසීම, වන්දි ප්‍රදානය කිරීම

- **නියාමන කාර්භාරය**

  නියමු උපදේශන නිකුත් කිරීම හා අධීක්ෂණය, අපරාධ සිදුවීම අඩු කළ හැකි ක්‍රම හා විධි පිළිබඳ ව පර්යේෂණ පැවැත්වීම හා ප්‍රවර්ධනය කිරීම, අපරාධ වැළැක්වීමේ ප්‍රතිපත්ති සම්බන්ධයෙන් නිර්දේශ නිකුත් කිරීම

# පොලිස් සහායක සහ ආරක්ෂක කොට්ඨාසය

2015 අංක 4 දරන පනත මගින් පිහිටුවන ලද තවත් එක් සුවිශේෂ ඒකකයක් වන්නේ ජාතික අධිකාරියේ උපදේශනය හා මඟ පෙන්වීම මත ශ්‍රී ලංකා පොලිසිය යටතේ පිහිටුවන ලද ''අපරාධයක වින්දිතයන්ගේ හා සාක්ෂිකරුවන්ගේ සහායක සහ ආරක්ෂක කොට්ඨාසය'' ලෙස හැඳින්වෙන විශේෂ පොලිස් ඒකකයයි. පනතේ 19 (2) වගන්තිය යටතේ කළමනාකරණ මණ්ඩලයට නිල බලයෙන් පත් කෙරෙන ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයාගේ අධීක්ෂණය යටතේ ක්‍රියාකරන ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරීවරයෙකු මෙම කොට්ඨාසය භාර ප්‍රධානියා ලෙස පත් කරනු ලැබ ඇති අතර 2016 නොවැම්බර් මස 03 වන දින සිට මෙහි කටයුතු ආරම්භ කර ඇත.

ජාතික අධිකාරිය මඟින් නිකුත් කරනු ලබන නියමු උපදේශන අනුගමනය කරමින් "කොට්ඨාසය" පවත්වා ගෙන යා යුතු අතර අපරාධයක වින්දිතයන්ට සහ සාක්ෂිකරුවන්ට ආරක්ෂාව සැලසීම, ඔවුන්ට හා ඔවුන්ගේ දේපළවලට සිදු කරනු ලබන තර්ජන, හානි පැමිණවීම් සම්බන්ධයෙන් වන පැමිණිල්ලක්, චෝදනාවක් හෝ තොරතුරක් පිළිබඳ ව "කොට්ඨාසය" විසින් ම පොලිස් නිලධරයෙකුගේ සහාය ඇති ව විමර්ශනය කිරීම කොට්ඨාසයේ කාර්ය විය යුතු අතර ඔවුන්ට ආරක්ෂාව සහ සහාය වීම සඳහා අධිකාරිය මඟින් නිකුත් කරනු ලබන මාර්ගෝපදේශ මත කාර්යක්ෂම පියවර ගැනීමට විධිවිධාන සැලසීමට අවශ්‍ය වැඩසටහන් ක්‍රියාත්මක කළ යුතු ය.

# <u>අධිකාරියෙහි කළමනාකරණ මණ්ඩලය</u>

පහත ප්‍රකාරව ජනාධිපතිවරයා විසින් පත් කළ සාමාජිකයින් :-

1. සභාපති : - ජනාධිපති නීතිඥ සුහද කේ.ගමලත් මහතා
   විශ්‍රාමික සොලිසිටර් ජනරාල්
   නීතිපති දෙපාර්තමේන්තුව



2. උදයකුමාර අමරසිංහ මහතා
   අපරාධ විද්‍යාව පිළිබඳ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
   ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය



3. වෛද්‍ය අජිත් තෙන්නකෝන් මහතා
   ප්‍රධාන අධිකරණ වෛද්‍ය නිලධාරී



4. වෛද්‍ය නීල් ප්‍රනාන්දු මහතා
   විශේෂඥ මනෝ වෛද්‍ය නිලධාරී



5. වෛද්‍ය හිරන්ති විජේමාන්න මහත්මිය
   විශේෂඥ වෛද්‍ය නිලධාරී



නිල බලයෙන් පත්වූ සාමාජිකයින්: -

1. ජනාධිපති නීතිඥ යසන්ත කෝදාගොඩ මහතා
   අතිරේක සොලිසිටර් ජනරාල්
   නීතිපති දෙපාර්තමේන්තුව
   ජනාධිපති නීතිඥ ප්‍රියන්ත නවාන මහතා
   අතිරේක සොලිසිටර් ජනරාල්
   නීතිපති දෙපාර්තමේන්තුව



2. එම්. ආර් ලතීෆ් මහතා
   ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති
   පොලිස් මූලස්ථානය
   ජගත් අබේසිරිගුනවර්ධන මහතා
   ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති රථවාහන හා මැතිවරණ
   පොලිස් මූලස්ථානය



3. නීතිඥ එච්.ජී.හුසේන් මහතා
   කොමසාරිස්
   මානව හිමිකම් කොමිෂන් සභාව



4. නීතිඥ පියුමන්ති පීරිස් මහත්මිය
   අතිරේක ලේකම් (නීති)
   අධිකරණ අමාත්‍යාංශය



5. විජිතා සෙනෙවිරත්න මහත්මිය
   අතිරේක ලේකම්
   නීතිය, සාමය හා දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශය



6. තුසිත පි. වනිගසිංහ මහතා
අතිරේක ලේකම්
ආරක්ෂක සහ නීතිය හා සාමය අමාත්‍යාංශය



7. එල්.ටී.ඩී. පෙරේරා මහත්මිය
නිරීක්ෂක (භාණ්ඩාගාර නියෝජිත)
මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය



## 2018 වර්ෂයේ විගණන හා කළමනාකරණ කමිටු සාමාජිකයින්

1. එල්.ටී.ඩී. පෙරේරා මිය - සභාපති
මහා භාණ්ඩාගාර නියෝජිත

2. පියුමන්ති පීරිස් මිය - අතිරේක ලේකම්
අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය

3. එච්.ජී. හුසේන් මයා - කොමසාරිස්
මානව හිමිකම් කොමිසම

4. විජිතා සෙනෙවිරත්න මිය - අතිරේක ලේකම්
ළමා හා කාන්තා කටයුතු අමාත්‍යාංශය

5. අයි.එන්. ප්‍රියන්ති මිය - නියෝජිත
ජාතික විගණන කාර්යාලය

# කාර්ය මණ්ඩලය - 2018

- **<u>ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කාර්ය මණ්ඩලය</u>**

| | | |
|---|---|---|
| 1.අධ්‍යක්ෂ ජනරාල් | - | උදයකුමාර අමරසිංහ මහතා |
| 2. අධ්‍යක්ෂ (නීති හා නීති බලාත්මක කිරීම) | - | එස්. එස්.කේ. කස්තුරිආරච්චි මෙනවිය |
| 3. අධ්‍යක්ෂ (ප්‍රතිපත්ති හා වැඩසටහන්) | - | අයි. සිරිවර්ධන මහතා |
| 4. අධ්‍යක්ෂ (පාලන හා කළමනාකරණ) | - | ඩබ්.ජී. එන්. ප්‍රනාන්දු මහතා |
| 5. අධ්‍යක්ෂ (මූල්‍ය) | - | ජී.ඩී.ආර්. පෙරේරා මහත්මිය |
| 6. සහකාර අධ්‍යක්ෂ (මූල්‍ය) | - | ආර්.ඒ.ඩී. චමිලා දිශානි මහත්මිය |
| 7. සහකාර අධ්‍යක්ෂ (නීති) | - | පී. එන්.යූ. පට්ටිආරච්චි මහත්මිය |
| 8. සහකාර අධ්‍යක්ෂ (පාලන ) | - | ඩබ්. එම්. අජිත් බණ්ඩාර මහතා |
| 9. කළමනාකරණ මණ්ඩල ලේකම් | - | බී.ජී. එම්.එස්.ආර්.ඩබ්. ගුණවර්ධන මහත්මිය |

- ***<u>තෘතීය මට්ටම</u>***

| | | |
|---|---|---|
| 1. නීති නිලධාරි | - | එස්.එස් දික්කුඹුර<br>ටී.එම්.පී.ඩී තෙන්නකෝන් |
| 2. අභ්‍යන්තර විගණන නිලධාරි | - | එම්.පී ජයවර්ධන |
| 3. විමර්ශන නිලධාරී | - | එච්.එම්.එස්.පී හේරත්<br>එච්.එස් .විජේනායක<br>ඩබ්.පී.කේ වික්‍රමසිංහ<br>ටී.ඒ.බී.සී ජයසේකර<br>එල්.සී.කේ ලියනගේ |
| 4. තොරතුරු නිලධාරී | - | එම්.ඒ.එස්.ටී මුණසිංහ |
| 5. භාෂා පරිවර්තක | - | ටී.ජේ ගුරුගමගේ |

- **<u>ද්විතීය කාර්ය මණ්ඩලය</u>**

**කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) නිලධාරීන් - 08**

1.සහන් හර්ෂණ අතුකෝරල මහතා

2. එස්.එන්.එච්. නදීෂා මධුමාලි නානායක්කාර මහත්මිය

3. පී.ඒ. දිලිනි දර්ශිකා පෙරේරා මෙනෙවිය

4. එම්.පී. සචිත්‍රා දුලාශනී ගුණසේකර මහත්මිය

5. අයි.ඒ. හර්ෂණී ඉලේපෙරුම මෙනෙවිය

6.දර්ශන් රජීව් ජයමණි මහතා

7. කේ.ඩී.අයේෂා කිත්මිණි ප්‍රනාන්දු මහත්මිය

8. සානිකා මධුරංගි මෙනෙවිය

- **<u>ප්‍රාථමික කාර්ය මණ්ඩලය</u>**

**රියදුරු**

**රියදුරුන් සංඛ්‍යාව - 06**

1. යූ.ඩබ්. විමංග පැතුම් මහතා
2. ඩී.එම්. සම්පත් නිශාන්ත බණ්ඩාර මහතා
3. ඒ. ප්‍රභාත් නිශාන්ත මහතා
4. එස්.බී. භාග්‍ය ප්‍රදීප් මදුසංක මහතා
5. කේ. කසුන් මදුශාන් විමුක්ති මහතා
6. එස්.ගාමිණී විජේකුමාර මහතා

**කාර්යාල කාර්ය සහායකවරුන්**

**කාර්යාල කාර්ය සහායකවරුන් - 05**

1 .ඩබ්. නදීශානී ප්‍රනාන්දු මෙනෙවිය

2. ජේ.ජී. චාමලී මල්කාන්ති විජේවික්‍රම මහත්මිය

3. ඩබ්.එම්. විමල බුද්ධික මහතා

4. ඒ.ඒ. ප්‍රදීප් කුමාර පෙරේරා මහතා

5. කසුන් මධුසංක යකුපිටිය මහතා


## අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරිය

## කාර්ය මණ්ඩල සාරාංශය -2019/12/31

### වගුව 01

| වර්ගය | වැටුප් කේතය | ක.සේ.දෙ. අනුමත කාර්ය මණ්ඩලය | දැනට පවතින කාර්ය මණ්ඩලය | පුරප්පාඩු |
|---|---|---|---|---|
| ***ජ්‍යෙෂ්ඨ මට්ටම*** | | | | |
| අධ්‍යක්ෂ ජනරාල් (වැඩ බලන) | HM 2-3 | 1 | 1 | 0 |
| අධ්‍යක්ෂ | HM 1-3 | 6 | 4 | 2 |
| සහකාර අධ්‍යක්ෂ | MM 1-3 | 3 | 3 | 0 |
| කළමනාකරණ මණ්ඩල ලේකම් | MM 1-3 | 1 | 1 | 0 |
| ***තෘතීය මට්ටම*** | | | | |
| නීති නිලධාරී | JM 1-1 | 2 | 2 | 0 |
| අභ්‍යන්තර විගණන නිලධාරී | JM 1-1 | 1 | 1 | 0 |
| විමර්ශන නිලධාරී | MA 4 | 6 | 5 | 1 |
| රැකවරණ නිලධාරී | MA 4 | 10 | 0 | 10 |
| සන්නිවේදන නිලධාරී | MA 4 | 1 | 0 | 1 |
| තොරතුරු නිලධාරී | MA 4 | 1 | 1 | 0 |
| භාෂා පරිවර්තක | MA 4 | 1 | 1 | 0 |
| ***ද්විතීය මට්ටම*** | | | | |
| කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) | MA 1-1 | 10 | 8 | 2 |
| ***ප්‍රාථමික මට්ටම*** | | | | |
| රියදුරු | PL 3 | 6 | 6 | 0 |
| කාර්යාල කාර්ය සහායක | PL 1 | 6 | 5 | 1 |
| එකතුව | | **55** | **38** | **17** |

## අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරියේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මඟින් අනුමත සේවක සංඛ්‍යාව



# කාර්ය සාධනය

# පාලන හා කළමනාකරණ අංශය

පහත පරිදි මාණ්ඩලික නොවන නිලධාරීන් පුහුණු පාඨමාලා සඳහා යොමු කර ඇත.

| පාඨමාලාවේ නම | ආයතනය | සහභාගී වූ නිලධාරීන්ගේ නම | කාල සීමාව |
|---|---|---|---|
| පොත් බැඳීම | ශ්‍රී ලංකා මුද්‍රණාලය | කසුන් මධුසංක යකුපිටිය | 16.01.2019- 27.03.2019 |
| පෞද්ගලික ලිපිගොනු නඩත්තුව | නිපුණතා සංවර්ධන අරමුදල | කේ.ඩී. අයේෂා කිත්මිණී ප්‍රනාන්දු | 28.01.2019-29.01.2019 |
| Misconducts Committed in Workplace of Disciplinary Inquiry | සී.අයි.පී.එම්. ආයතනය (Charted Institute of Personnel Management) | ඩබ්.එම්. අජිත් බණ්ඩාර | 26.02.2019 |
| රාජ්‍ය ආයතන වල විගණන විමසුම් වාර ගණන අඩුකිරීම සම්බන්ධව | නිපුණතා සංවර්ධන අරමුදල | ආර්.ජ්.ඩී.සී. චමිලා දිශානි | 28.02.2019-01.03.2019 |
| රාජ්‍ය ආයතන වල නිවාඩු ලබාගැනීම සම්බන්ධව | නිපුණතා සංවර්ධන අරමුදල | 01. උමේෂා හෂිනි ලොකුසූරිය.<br>02. කේ.ඩී. අයේෂා කිත්මිණී ප්‍රනාන්දු | 11.03.2019-12.03.2019 |
| රියදුරන්ගේ සහ කාර්යාල කාර්යය සහයකවරුන්ගේ රාජකාරි හා වගකීම් සම්බන්ධව | නිපුණතා සංවර්ධන අරමුදල | 01. කසුන් මධුශංක විමුක්ති<br>02. කසුන් මධුසංක යකුපිටිය | 11.03.2019-12.03.2019 |
| නිවාඩු නිලධරයාගේ භූමිකාව සහ ඔහුට ඇති වගකීම් සම්බන්ධව | ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය | උමේෂා හෂිනි ලොකුසූරිය | 07.05.2019 |
| ධනාත්මක චින්තනය | ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය | දර්ශන් රජීව් ජයමණි | 10.05.2019 |
| විගණන කමිටු වලට පිළිතුරු බැඳීම | ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය | ඩබ්.එම්. අජිත් බණ්ඩාර | 22.05.2019-23.05.2019 |
| ගොනු නඩත්තුව | ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය | 01. කේ.ඩී. අයේෂා කිත්මිණී ප්‍රනාන්දු<br>02. දර්ශන් රජීව් ජයමණි<br>03. දිලිනි දර්ශිකා පෙරේරා<br>04. නදීශා නානායක්කාර | 11.06.2019 |
| කාර්යාල කාර්යය සහායක පුහුණු වැඩමුළුව | ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය | 01. ජේ.ජී.සී. මල්කාන්ති විජේවික්‍රම | 12.06.2019-13.06.2019 |

| | | | |
|---|---|---|---|
| | | 02. ඩබ්.එච්.ආර්. මධුකා ප්‍රබෝධනී | |
| ගිණුම් ලිපිකරුගේ භූමිකාව හා වගකීම් සම්බන්ධව | ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය | දිලිනි දර්ශිකා පෙරේරා | 10.06.2019 |
| 5S ක්‍රමය | ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය | 01. හර්ෂණී ඉලේපෙරුම<br>02. සහන් හර්ෂණ අතුකෝරළ<br>03. දිලිනි දර්ශිකා පෙරේරා | 09.05.2019-23.05.2019 |
| කාර්යාල කළමනාකරණය සම්බන්ධ නිපුණතා පුහුණුව | ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය | කේ.ඩී. අයේෂා කිත්මිණී ප්‍රනාන්දු | 18.07.2019-26.07.2019 |
| දෙමළ භාෂා පුහුණුව | අධිකරණමය නොවන නිලධාරීන් පුහුණු කිරීමේ මධ්‍යස්ථානය | සියළුම කාර්යාල කාර්ය සහායකවරු | 14.09.2019-03.08.2019 |
| ලිපිකරු කුසලතා සම්බන්ධ වැඩමුළුව | නිපුණතා සංවර්ධන අරමුදල | 01. එම්.ඒ. සශික තිරාජ් මුණසිංහ<br>02. තත්මිණී ජයංගනා ගුරුගමගේ<br>03. ඩබ්.පී. සානිකා මධුරංගි රණතුංග | 16.09.2019-18.06.2019 |
| මිල ගණන් විශ්ලේශණයේ ප්‍රායෝගික අංශ | නිපුණතා සංවර්ධන අරමුදල | හර්ෂණී ඉලේපෙරුම | 30.08.2019-31.08.2019 |
| රාජ්‍ය මුදල් රෙගුලාසි | මිලෝදා ආයතනය | මේනකා පියුමාලි ජයවර්ධන | 09.10.2019-11.10.2019 |
| සුපරීක්ෂක කුසලතා | සී.අයි.පී.එම්. ආයතනය (Charted Institute of Personnel Management) | 01. ඩබ්.එම්. අජිත් බණ්ඩාර<br>02. පී.එන්.යූ. පට්ටිආරච්චි | 22.10.2019-24.10.2019 |
| ප්‍රසම්පාදන හා සන්නිවේදන උපකරණ විශ්ලේශනය | නිපුණතා සංවර්ධන අරමුදල | එම්.ඒ. සශික තිරාජ් මුණසිංහ | 04.11.2019-05.11.2019 |
| ප්‍රවාහන කළමනාකරණය | නිපුණතා සංවර්ධන අරමුදල | ඩබ්.පී. සානිකා මධුරංගි රණතුංග | 09.12.2019-10.12.2019 |
| රාජ්‍ය අංශීය කාර්යාල ක්‍රම සම්බන්ධව | (දුරස්ථ අධ්‍යයන කේන්ද්‍රය) Distance Learning Centre Ltd | 01. කේ.ඩී. අයේෂා කිත්මිණී ප්‍රනාන්දු<br>02. දර්ශන් රජීව් ජයමණි | 09.12.2019-10.12.2019 |
| සන්නිවේදන උපකරණ සම්බන්ධ ප්‍රසම්පාදනය | (දුරස්ථ අධ්‍යයන කේන්ද්‍රය) Distance Learning Centre Ltd | එම්.ඒ. සශික තිරාජ් මුණසිංහ | 09.12.2019-12.12.2019 |

එමෙන්ම පහත පරිදි අධිකාරියේ කාර්යය මණ්ඩලය විදේශීය පුහුණු සඳහා සහභාගි විය.

| මාණ්ඩලික නිලධරයාගේ නම | තනතුර | පාඨමාලාවේ තේමාව | වියදම | රට | කාල සීමාව |
|---|---|---|---|---|---|
| ඒ.ආර්.පී.සී. උදයකුමාර මයා | අධ්‍යක්ෂ ජනරාල් | අපරාධයක වින්දිතයන්ගේ සහ සාක්ෂිකරුවන් අධ්‍යයනය කිරීම | ප්‍රධානයකි | ඕස්ට්‍රේලියාව | 2019.03.25 – 2019.03.29 |
| එස්.එස්.කේ. කස්තුරිආරච්චි මෙය | අධ්‍යක්ෂ (නීති හා නීති බලාත්මක කිරීම) | අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් පිළිබඳ අධ්‍යයනය | ප්‍රධානයකි | ඕස්ට්‍රේලියාව | 2019.03.25 – 2019.03.29 |
| අයි. සිරිවර්ධන මයා | අධ්‍යක්ෂ (ප්‍රතිපත්ති හා වැඩසටහන්) | ආසියාවේ වින්දිතයන් හට සහාය දැක්විම | ප්‍රධානයකි | කොරියාව | 2019.03.24 – 2019.03.26 |
| | | ත්‍රස්තවාදය නිසා වින්දිතභාවයට පත්වූවන් හට උපකාර කිරීම සඳහා අධිකාරීන් හා සිවිල් සංවිධාන අතර පැවතිය යුතු සහයෝගීතාවය පිළිබඳව | ප්‍රධානයකි | සිංගප්පූරුව | 2019.06.18 – 2019.06.20 |
| බී.ජී.එම්.එස්.ආර්. ඩබ්. ගුණවර්ධන මිය | කළමනාකරණ මණ්ඩල ලේකම් | අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් පිළිබඳ අධ්‍යයනය | ප්‍රධානයකි | ඕස්ට්‍රේලියාව | 2019.03.25 – 2019.03.29 |
| ඩබ්.එම්.ඒ. බණ්ඩාර මයා | සහකාර අධ්‍යක්ෂ (පාලන) | අත්දැකීම් මත පදනම් වූ අධ්‍යාපන ක්‍රමයක් තුළින් සංවිධානාත්මක හැකියාවන් වර්ධනය කරගැනීම පිළිබඳව | ඒකාබද්ධ අරමුදල | ඉන්දියාව | 2019.07.06 – 2019.07.12 |
| ආර්.ඒ.ඩී.සී. දිශානි මිය | සහකාර අධ්‍යක්ෂ (මූල්‍ය) | අත්දැකීම් මත පදනම් වූ අධ්‍යාපන ක්‍රමයක් තුළින් සංවිධානාත්මක හැකියාවන් වර්ධනය කරගැනීම පිළිබඳව | ඒකාබද්ධ අරමුදල | ඉන්දියාව | 2019.07.06 – 2019.07.12 |
| පී.එන්.යූ. පට්ටිආරච්චි මිය | සහකාර අධ්‍යක්ෂ (නීති) | අත්දැකීම් මත පදනම් වූ අධ්‍යාපන ක්‍රමයක් තුළින් සංවිධානාත්මක හැකියාවන් වර්ධනය කරගැනීම පිළිබඳව | ඒකාබද්ධ අරමුදල | ඉන්දියාව | 2019.07.06 – 2019.07.12 |

2019 මාර්තු මාසයේදී ආසියාවේ වින්දිතයන් හට සහාය දැක්වීම සඳහා දකුණු කොරියාවේදී පැවැත්වූ ජාත්‍යන්තර සම්මන්ත්‍රනයේදී අධිකාරියේ අධ්‍යක්ෂ (ප්‍රතිපත්ති හා වැඩසටහන්) සහාභාගී වීම.






2019 ජූලි මාසයේදී ඉන්දියාව වේ පැවති අත්දැකීම් මත පදනම් වූ අධ්‍යාපන ක්‍රමයක් තුළින් සංවිධානාත්මක හැකියාවන් වර්ධනය කරගැනීම පිළිබඳව ජාත්‍යන්තර වැඩමුළුවට සහකාර අධ්‍යක්ෂ (පාලන), සහකාර අධ්‍යක්ෂ (මූල්‍ය), සහ සහකාර අධ්‍යක්ෂ (නීති) සහාභාගී වීම.




- 2019 වර්ෂයේදී නීති නිලධාරීන් දෙදෙනෙක් (02), අභ්‍යන්තර විගණන නිලධාරීන් එකක් (01), විමර්ශන නිලධාරීන් පහක් (05), තොරතුරු නිලධාරීන් එකක් (01) සහ භාෂා පරිවර්තක එකක් (01) වශයෙන් ආයතනයට බඳවා ගත් අතර කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) දෙදෙනෙක් (02) ආයතනය හැර ගියේය.


- 2019.01.01 සිට 2019.12.31 දක්වා කළමනාකරණ මණ්ඩල රැස්වීම් 20 ක් පවත්වා ඇත.

- අධිකාරියේ අභ්‍යන්තර විගණන ඒකකය පිහිටුවනු ලැබුවේ 2019 ජූනි මාසයේදීය. 2019 වසර තුල විගණකාධිපති විගණන විමසුම් 3 ක් සහ අභ්‍යන්තර විගණන විමසුම් 4 ක් පවත්වා ඇති අතර එම විගණන විමසුම් සියල්ල සඳහාම මේ වන විට පිළිතුරු ලබා දී ඇත.

- අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන්ගේ ආරක්ෂන අරමුදල හඳුන්වාදීම සහ පිහිටුවීම සිදුකරන ලද අතර අධිකරණ වන්දි මුදල් වලින් කොටසක් එම අරමුදලට බැරවීම සිදුවේ.

අධිකාරියේ 2019.12.31 වන දින වන විට අධිකාරිය සඳහා බඳවා ගෙන ඇති නිලධාරීන් පිළිබඳව විස්තර පහත පරිදි වේ.


| සේවා වර්ගය | ක.සේ.දෙ. අනුමත කාර්ය මණ්ඩලය | දැනට පවතින කාර්ය මණ්ඩලය |
|---|---|---|
| **ජ්‍යෙෂ්ඨ මට්ටම**<br>අධ්‍යක්ෂ ජනරාල්<br>අධ්‍යක්ෂ<br>සහකාර අධ්‍යක්ෂ<br>කළමනාකරණ මණ්ඩල ලේකම් | 11 | 9 |
| **තෘතීය මට්ටම**<br>නීති නිලධාරි<br>අභ්‍යන්තර විගණන නිලධාරි<br>විමර්ශන නිලධාරි<br>රැකවරණ නිලධාරි<br>සන්නිවේදන නිලධාරි<br>තොරතුරු නිලධාරි<br>භාෂා පරිවර්තක | 22 | 10 |
| **ද්විතීය මට්ටම**<br>කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) | 10 | 8 |
| **ප්‍රාථමික මට්ටම**<br>රියදුරු<br>කාර්යාල කාර්යය සහායක | 12 | 11 |
| එකතුව | **55** | **38** |



# නීති හා නීති බලාත්මක කිරීමේ අංශය

2019 වසරේ ජනවාරි මස 01 වන දින සිට 2019 දෙසැම්බර් 31 දක්වා අපරාධයක වින්දිතයන් හා සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරියේ නීති හා නීති බලාත්මක කිරීමේ අංශය වෙත මහජනතාව හා රාජ්‍ය ආයතන වෙතින් යොමු කරන ලද ඉල්ලීම් සහ පැමිණිලි ගණන 252ක් වේ. එක් ලිපියක ඉල්ලීම් කිහිපයක් පැවති අවස්ථාද දක්නට ලැබුණු අතර අදාළ ලිපි ඒවායේ සඳහන් ඉල්ලීම් අනුව පහත පරිදි වර්ගීකරණය කරන ලදී.

| ඉල්ලීමේ ස්වභාවය | ඉල්ලීම් ගණන |
|---|---|
| අයිතිවාසිකම් හා හිමිකම් උල්ලංඝනය කිරීම පිළිබඳ පැමිණිලි | 75 |
| 8,9 වගන්තිය යටතේ වන වැරදි සම්බන්ධයෙන් වන පැමිණිලි | 02 |
| ආරක්ෂාව අපේක්ෂාවෙන් කරන ලද ඉල්ලීම් | 33 |
| සහාය අපේක්ෂාවෙන් කරන ලද ඉල්ලීම් | 16 |
| අයිතිවාසිකම් හා හිමිකම් උල්ලංඝනය කිරීම් පිළිබඳ පැමිණිලි සහ සහාය අපේක්ෂාවෙන් කරන ලද ඉල්ලීම් | 02 |
| අයිතිවාසිකම් හා හිමිකම් උල්ලංඝනය කිරීම් පිළිබඳ පැමිණිලි සහ 8,9 වගන්තිය යටතේ වන වැරදි සම්බන්ධයෙන් වන පැමිණිලි | 03 |
| 8,9 වගන්තිය යටතේ වන වැරදි සම්බන්ධයෙන් වන පැමිණිලි සහ ආරක්ෂාව අපේක්ෂාවෙන් කරන ලද ඉල්ලීම් | 33 |
| ආරක්ෂාව අපේක්ෂාවෙන් කරන ලද ඉල්ලීම් සහ සහාය අපේක්ෂාවෙන් කරන ලද ඉල්ලීම් | 02 |
| අයිතිවාසිකම් හා හිමිකම් උල්ලංඝනය කිරීම් පිළිබඳ පැමිණිලි සහ ආරක්ෂාව අපේක්ෂාවෙන් කරන ලද ඉල්ලීම් | 13 |
| 8,9 වගන්තිය යටතේ වන වැරදි සම්බන්ධයෙන් වන පැමිණිලි, ආරක්ෂාව අපේක්ෂාවෙන් කරන ලද ඉල්ලීම් සහ සහාය අපේක්ෂාවෙන් කරන ලද ඉල්ලීම් | 01 |
| අයිතිවාසිකම් සහ හිමිකම් උල්ලංඝනය කිරීම් පිළිබඳ පැමිණිලි, 8,9 වගන්තිය යටතේ වන වැරදි සම්බන්ධයෙන් වන පැමිණිලි සහ ආරක්ෂාව අපේක්ෂාවෙන් ලද ඉල්ලීම් | 07 |
| අයිතිවාසිකම් සහ හිමිකම් උල්ලංඝනය කිරීම් පිළිබඳ පැමිණිලි, 8,9 වගන්තිය යටතේ වන වැරදි සම්බන්ධයෙන් වන පැමිණිලි, සහාය අපේක්ෂාවෙන් කරන ලද ඉල්ලීම් සහ ආරක්ෂාව අපේක්ෂාවෙන් කරන ලද ඉල්ලීම් | 01 |
| වෙනත් ඉල්ලීම් | 64 |
| **එකතුව** | **252** |




2017 වසරේ සහ 2018 වසරේ පැමිණිලි අතුරින් පැමිණිලි 84ක් 2019.01.01 වන විටත් අවසන්ව නොපැවති අතර මේ අනුව පැමිණිලි 336ක් 2019 වසර තුළ විමර්ශනයට භාජනය කර ලදී. අධිකාරියට ලැබුණු සමස්ථ පැමිණිලි අතරින් පැමිණිලි 61 ක විමර්ශන කටයුතු 2019 වසර අවසන් වන විට සම්පූර්ණයෙන්ම අවසන් කර ඇත. එකී පැමිණිලි සම්බන්ධයෙන් අධිකාරිය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග පහත පරිදි වේ.

| පැමිණිලි වල ස්භාවය | **2019** |
|---|---|
| අවසන් කරන ලද පැමිණිලි සංඛ්‍යාව | 61 |
| ආරක්ෂාව සපයන ලද පැමිණිලි සංඛ්‍යාව | 14 |
| බහා තබන ලද පැමිණිලි සංඛ්‍යාව | 03 |
| නීතිඥ සහාය ලබා දීම සඳහා යොමු කරන ලද පැමිණිලි සංඛ්‍යාව | 02 |
| විමර්ශනය කරණු ලබන පැමිණිලි සංඛ්‍යාව | 166 |
| 16 වගන්තිය යටතේ විමර්ශන පවත්වනු ලබන පැමිණිලි ගණන | 01 |
| වෙනත් ආයතනය වලට යොමු කරන ලද පැමිණිලි සංඛ්‍යාව | 05 |
| **අධිකාරියට ලැබී ඇති මුළු පැමිණිලි සංඛ්‍යාව** | **252** |

එමෙන්ම පොලිස් ස්ථාන මගින් උපදෙස් පතා අධිකාරිය වෙත පැමිණිලි යොමු කරනු ලබන අතර එකී පැමිණිලි වලට අදාලව ගෙන ඇති ක්‍රියාමාර්ග පහත පරිදි වේ.

| | |
|---|---|
| උපදෙස් පතා පොලිස් ස්ථාන වලින් යොමුකරන ලද ලිපිගොනු සංඛ්‍යාව | 26 |
| පොලිස් ස්ථාන වලට උපදෙස් දී අවසන් කරන ලද ලිපිගොනු සංඛ්‍යාව | 08 |

- 2015 අංක 4 දරන අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනතේ 24 (1) වගන්තිය යටතේ අධිකරණ සහ කොමිෂන් සභා වෙතින් නියෝග 11 ක් අධිකාරිය වෙත ලැබුණු අතර එකී සෑම නියෝගයක් සම්බන්ධයෙන්ම ආරක්ෂාව ලබා දීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලදි.
- 2015 අංක 4 දරන අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනතේ 29 වගන්තිය ප්‍රකාරව අධිකාරියේ ආරක්ෂණ අරමුදල ස්ථාපිත කර ඇති අතර 2019 දෙසැම්බර් 31 වන විට එය මිලියන 3.9ක් දක්වා වර්ධනය වී ඇත.
- තවද 2015 අංක 4 දරන අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනතේ 4(1) වගන්තිය ප්‍රකාරව අධිකරණ හෝ අර්ධ අධිකරණ කටයුත්තකට සහභාගී වීම සඳහා අධිකරණය වෙත යාමේදී ආහාර, නවාතැන් සහ ප්‍රවාහනය වෙනුවෙන් වැය වන වියදම් අධිකාරියේ ආරක්ෂණ අරමුදලෙන් ගෙවන ලෙස අධිකරණයෙන් ඉල්ලීමක් ලද විට උපරිමය රුපියල් පන්දහසකට යටත්ව එම වියදම් ගෙවීමට 2019.11.15 වන දින පැවති අධිකාරියේ කළමණාකරණ මණ්ඩල රැස්වීමේදී තීරණය කරන ලදී. එවැනි ඉල්ලම් දෙකක් 2019 වර්ෂයේ ඉදිරිපත් වූ අතර එක් ඉල්ලීමක් සම්බන්ධයෙන් මෙම වර්ෂයේදීම මුදල් ලබා දීම සිදු කෙරුණි.

**2019 වසර තුලදී විමර්ශනය අවසන් කරන ලද පැමිණිලිවල සාරාංශය**

| ඉල්ලීමේ ස්වභාවය | අනු අංකය | ප්‍රතිඵලය |
|---|---|---|
| අයිතිවාසිකම් හා හිමිකම් උල්ලංඝනය කිරීම පිළිබඳ පැමිණිලි | VWPA/L&LE/RE/08/19 | කඹුරුපිටිය පොලිස් ස්ථානය විසින් යොමු කර ඇති වාර්තාව අනුව අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇති බැවින් මෙම ලිපිගොනුවේ කටයුතු අවසන් කරන ලදි. |
| | VWPA/L&LE/RE/23/19 | 2015 අංක 4 දරන පනතේ විෂය පථයට අයත් නොවන බැවින් මෙම ලිපිගොනුවේ කටයුතු අවසන් කරන ලදි. |
| | VWPA/L&LE/RE/32/19 | පොලිසිය විසින් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇති බැවින් ලිපිගොනුවේ කටයුතු අවසන් කරන ලදි. |
| | VWPA/L&LE/RE/41/19 | මෙම පැමිණිල්ල සම්බන්ධයෙන් ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම සඳහා ප්‍රමාණවත් තොරතුරු ලබා දී නොමැති බැවින් ලිපිගොනුවේ කටයුතු අවසන් කරන ලදි. |
| | VWPA/L&LE/RE/49/19 | පැමිණිල්ලට අදාල කරුණ සම්බන්ධයෙන් අධිකරණයේ නඩු පවරා ඇති බැවින් ලිපි ගොනුවේ කටයුතු අවසන් කරන ලදි. |
| | VWPA/L&LE/RE/25/19 | පොලිසිය විසින් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇති බැවින් ලිපිගොනුවේ කටයුතු අවසන් කරන ලදි. |
| | VWPA/L&LE/RE/31/19 | පොලිසිය විසින් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇති බැවින් ලිපිගොනුවේ කටයුතු අවසන් කරන ලදි. |
| | VWPA/L&LE/RE/54/19 | පොලිසිය විසින් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇති බැවින් ලිපිගොනුවේ කටයුතු අවසන් කරන ලදි. |
| | VWPA/L&LE/RE/55/19 | මෙම පැමිණිල්ලට අදාල කරුණ සිවිල් ආරවුලක් බැවින් පනතේ විෂය පථයට අයත් නොවේ. එබැවින් මෙම ලිපිගොනුවේ කටයුතු අවසන් කරන ලදි. |
| | VWPA/L&LE/RE/45/19 | පොලිසිය විසින් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇති බැවින් ලිපිගොනුවේ කටයුතු අවසන් කරන ලදි. |
| | VWPA/L&LE/RE/14/19 | ලිපි ගොනුව නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත. |
| | VWPA/L&LE/RE/30/19 | දැරණියගල පොලිස් ස්ථානය විසින් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇති බැවින් මෙම ලිපිගොනුවේ කටයුතු අවසන් කරන ලදි. |


| | | |
|---|---|---|
| | VWPA/L&LE/RE/73/19 | වැල්ලවත්ත පොලිස් ස්ථානය විසින් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇති බැවින් මෙම ලිපිගොනුවේ කටයුතු අවසන් කරන ලදි. |
| ආරක්ෂාව අපේක්ෂාවෙන් කරන ලද ඉල්ලීම් | VWPA/L&LE/P/01/19 | තර්ජනයක් නොමැති බැවින් මෙම ලිපිගොනුවේ කටයුතු අවසන් කරන ලදි. |
| | VWPA/L&LE/P/04/19 | 2015 අංක 4 දරන පනතේ විෂය පථයට අයත් නොවන බැවින් මෙම ලිපිගොනුවේ කටයුතු අවසන් කරන ලදි. |
| | VWPA/L&LE/P/28/19 | පොලිසිය විසින් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇති බැවින් ලිපිගොනුවේ කටයුතු අවසන් කරන ලදි |
| | VWPA/L&LE/P/34/19 | අපරාධයක වින්දිතයන්ගේ සහ සාක්ෂිකරුවන්ගේ සහායක සහ ආරක්ෂක කොට්ඨාස වාර්තාවට අනුව තර්ජනයක් අනාවරණය නොවන බැවින් මෙම ලිපිගොනුවේ කටයුතු අවසන් කරන ලදි. |
| | VWPA/L&LE/P/25/19 | තර්ජනයක් අනාවරණය නොවන බැවින් මෙම ලිපිගොනුවේ කටයුතු අවසන් කරන ලදි. |
| | VWPA/L&LE/P/41/19 | තර්ජනයක් අනාවරණය නොවන බැවින් සහ පොලිසිය විසින් වගඋත්තරකාර පියා මේ වන විටත් අත් අඩංගුවට ගෙන ඇති බැවින් මෙම ලිපිගොනුවේ කටයුතු අවසන් කරන ලදි |
| | VWPA/L&LE/P/06/19 | අවශය උපදෙස් සර්වෝදය මහලේකම්හට දෙන ලදී. |
| 8,9 වගන්තිය යටතේ වන වැරදි සම්බන්ධයෙන් වන පැමිණිලි සහ ආරක්ෂාව අපේක්ෂාවෙන් කරන ලද ඉල්ලීම් | VWPA/L&LE/O /15/19<br>VWPA/L&LE/P/21/19 | 2015 අංක 4 දරන පනතේ විෂය පථයට අයත් නොවන බැවින් මෙම ලිපිගොනුවේ කටයුතු අවසන් කරන ලදි. |
| | VWPA/L&LE/O /02/19<br>VWPA/L&LE/P/03/19 | තර්ජනයක් අනාවරණය නොවන බැවින් මෙම ලිපිගොනුවේ කටයුතු අවසන් කරන ලදි. |
| අයිතිවාසිකම් හා හිමිකම් උල්ලංඝනය කිරීම් පිළිබඳ පැමිණිලි සහ සහාය අපේක්ෂාවෙන් සිදු කරන ලද ඉල්ලීම් | VWPA/L&LE/RE/35/19<br>VWPA/L&LE/A/02/19 | පොලිසිය විසින් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇති බැවින් ලිපිගොනුවේ කටයුතු අවසන් කරන ලදි. |
| අයිතිවාසිකම් හා හිමිකම් උල්ලංඝනය කිරීම් පිළිබඳ පැමිණිලි සහ ආරක්ෂාව අපේක්ෂාවෙන් සිදු කරන ලද ඉල්ලීම් | VWPA/L&LE/P/47/19<br>VWPA/L&LE/RE/47/19 | පොලිසිය විසින් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇති බැවින් ලිපිගොනුවේ කටයුතු අවසන් කරන ලදි. |
| | VWPA/L&LE/RE/06/19<br>VWPA/L&LE/P/11/19 | තර්ජනයක් අනාවරණය නොවන බැවින් මෙම ලිපිගොනුවේ කටයුතු අවසන් කරන ලදි |
| | VWPA/L&LE/RE/06/19<br>VWPA/L&LE/P/11/19 | අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇති බැවින් ලිපිගොනුවේ කටයුතු අවසන් කරන ලදි. |
| | VWPA/L&LE/RE/06/19<br>VWPA/L&LE/P/11/19 | පොලිසිය විසින් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇති බැවින් ලිපිගොනුවේ කටයුතු අවසන් කරන ලදි |
| අයිතිවාසිකම් හා හිමිකම් උල්ලංඝනය කිරීම් පිළිබඳ පැමිණිලි සහ 8,9 වගන්තිය යටතේ වන වැරදි | VWPA/L&LE/RE/33/19<br>VWPA/L&LE/O/22/19 | |

| | | |
|---|---|---|
| සම්බන්ධයෙන් වන පැමිණිලි | | වින්දිතයාට එරෙහිව පනතේ 08 හෝ 09 වගන්ති යටතේ වරදක් අනාවරණය නොවන බැවින් මෙම ලිපි ගොනුවේ කටයුතු අවසන් කරන ලදි. |
| ආරක්ෂාව අපේක්ෂාවෙන් සිදු කරන ලද ඉල්ලීම් සහ සහාය අපේක්ෂාවෙන් සිදු කරන ලද ඉල්ලීම් | VWPA/L&LE/P/22/19<br>VWPA/L&LE/A/05/19 | තර්ජනයක් අනාවරණය නොවන බැවින් මෙම ලිපිගොනුවේ කටයුතු අවසන් කරන ලදි |
| අයිතිවාසිකම් හා හිමිකම් උල්ලංඝනය කිරීම් පිළිබඳ පැමිණිලි ,8,9 වගන්තිය යටතේ වන වැරදි සම්බන්ධයෙන් වන පැමිණිලි , ආරක්ෂාව අපේක්ෂාවෙන් සිදු කරන ලද ඉල්ලීම් සහ සහාය අපේක්ෂාවෙන් සිදු කරන ලද ඉල්ලීම් | VWPA/L&LE/O /15/19<br>VWPA/L&LE/P/21/19<br>VWPA/L&LE/RE/07/19<br>VWPA/L&LE/A/03/19 | තර්ජනයක් අනාවරණය නොවන බැවින් මෙම ලිපිගොනුවේ කටයුතු අවසන් කරන ලදි |
| වෙනත් ඉල්ලීම් | VWPA/L&LE/O.com/01/19 | අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සඳහා අධිකරණ මානව හිමිකම් සහ නීති ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය වෙත යොමු කර ඇත. |
| | VWPA/L&LE/O.com/05/19 | 2015 අංක 4 දරන පනතේ විෂය පථයට අයත් නොවන බැවින් මෙම ලිපිගොනුවේ කටයුතු අවසන් කරන ලදි. |
| | VWPA/L&LE/O.com/07/19 | පොලිස් ස්ථානය විසින් අදාල ගැටළුව සමථයකට පත් කර ඇති බැවින් ලිපිගොනුවේ කටයුතු අවසන් කරන ලදි. |
| | VWPA/L&LE/O.com/02/19 | 2015 අංක 4 දරන පනතේ විෂය පථයට අයත් නොවන බැවින් මෙම ලිපිගොනුවේ කටයුතු අවසන් කරන ලදි. |
| | VWPA/L&LE/O.com/10/19 | 2015 අංක 4 දරන පනතේ විෂය පථයට අයත් නොවන බැවින් මෙම ලිපිගොනුවේ කටයුතු අවසන් කරන ලදි. |
| | VWPA/L&LE/O.com/07/19 | පොලිසිය විසින් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇත. |
| | VWPA/L&LE/O.com/12/19 | 2015 අංක 4 දරන පනතේ විෂය පථයට අයත් නොවන බැවින් මෙම ලිපිගොනුවේ කටයුතු අවසන් කරන ලදි. |
| | VWPA/L&LE/O.com/3/19 | මැදිරිගිරිය පොලිසිය විසින් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇත. |
| | VWPA/L&LE/O.com/20/19 | 2015 අංක 4 දරන පනතේ විෂය පථයට අයත් නොවන බැවින් මෙම ලිපිගොනුවේ කටයුතු අවසන් කරන ලදි. |
| | VWPA/L&LE/O.com/18/19 | 2015 අංක 4 දරන පනතේ විෂය පථයට අයත් නොවන බැවින් මෙම ලිපිගොනුවේ කටයුතු අවසන් කරන ලදි. |
| | VWPA/L&LE/O.com/24/19 | 2015 අංක 4 දරන පනතේ විෂය පථයට අයත් නොවන බැවින් මෙම ලිපිගොනුවේ කටයුතු අවසන් කරන ලදි. |
| | VWPA/L&LE/O.com/09/19 | රත්මලාන පොලිසිය විසින් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇත. |
| | VWPA/L&LE/O.com/21/19 | 2015 අංක 4 දරන පනතේ විෂය පථයට අයත් නොවන බැවින් මෙම ලිපිගොනුවේ කටයුතු අවසන් කරන ලදි. |

| | | |
|---|---|---|
| | VWPA/L&LE/O.com/23/19 | 2015 අංක 4 දරන පනතේ විෂය පථයට අයත් නොවන බැවින් මෙම ලිපිගොනුවේ කටයුතු අවසන් කරන ලදි. |
| | VWPA/L&LE/O.com/25/19 | 2015 අංක 4 දරන පනතේ විෂය පථයට අයත් නොවන බැවින් මෙම ලිපිගොනුවේ කටයුතු අවසන් කරන ලදි. |
| | VWPA/L&LE/O.com/27/19 | 2015 අංක 4 දරන පනතේ විෂය පථයට අයත් නොවන බැවින් මෙම ලිපිගොනුවේ කටයුතු අවසන් කරන ලදි. |
| | VWPA/L&LE/O.com/28/19 | 2015 අංක 4 දරන පනතේ විෂය පථයට අයත් නොවන බැවින් මෙම ලිපිගොනුවේ කටයුතු අවසන් කරන ලදි. |
| | VWPA/L&LE/O.com/32/19 | 2015 අංක 4 දරන පනතේ විෂය පථයට අයත් නොවන බැවින් මෙම ලිපිගොනුවේ කටයුතු අවසන් කරන ලදි. |
| | VWPA/L&LE/O.com/33/19 | 2015 අංක 4 දරන පනතේ විෂය පථයට අයත් නොවන බැවින් මෙම ලිපිගොනුවේ කටයුතු අවසන් කරන ලදි. |
| | VWPA/L&LE/O.com/38/19 | 2015 අංක 4 දරන පනතේ විෂය පථයට අයත් නොවන බැවින් මෙම ලිපිගොනුවේ කටයුතු අවසන් කරන ලදි. |
| | VWPA/L&LE/O.com/20/19 | |
| | VWPA/L&LE/O.com/42/19 | 2015 අංක 4 දරන පනතේ විෂය පථයට අයත් නොවන බැවින් මෙම ලිපිගොනුවේ කටයුතු අවසන් කරන ලදි. |
| | VWPA/L&LE/O.com/19/19 | 2015 අංක 4 දරන පනතේ විෂය පථයට අයත් නොවන බැවින් මෙම ලිපිගොනුවේ කටයුතු අවසන් කරන ලදි. |
| | VWPA/L&LE/O.com/13/19 | |
| | VWPA/L&LE/O.com/56/19 | 2015 අංක 4 දරන පනතේ විෂය පථයට අයත් නොවන බැවින් මෙම ලිපිගොනුවේ කටයුතු අවසන් කරන ලදි. |
| | VWPA/L&LE/O.com/53/19 | 2015 අංක 4 දරන පනතේ විෂය පථයට අයත් නොවන බැවින් මෙම ලිපිගොනුවේ කටයුතු අවසන් කරන ලදි. |
| | VWPA/L&LE/O.com/58/19 | 2015 අංක 4 දරන පනතේ විෂය පථයට අයත් නොවන බැවින් මෙම ලිපිගොනුවේ කටයුතු අවසන් කරන ලදි. |
| | VWPA/L&LE/O.com/50/19 | 2015 අංක 4 දරන පනතේ විෂය පථයට අයත් නොවන බැවින් මෙම ලිපිගොනුවේ කටයුතු අවසන් කරන ලදි. |
| | VWPA/L&LE/O.com/47/19 | විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත යොමු කර ඇත. |
| | VWPA/L&LE/O.com/34/19 | පැමිණිලිකරු අනෙක් පාර්ශවය සමඟ සමථයකට පත්ව ඇති බැවින් මෙම ලිපිගොණුවේ කටයුතු අවසන් කරන ලදි. |
| | VWPA/L&LE/O.com/11/19 | පොලිසිය විසින් මෙය විමර්ශනය කර ඇත. |

- 2019 මාර්තු මස සිට අධිකාරිය ක්ෂණිකව සම්බන්ධ කරගත හැකි දුරකතන අංකය ලෙස 1985 විදුලි සංදේශ නියාමන කොමිසම මගින් ලබගත් අතර ඒ සඳහා ලැබුණු ඇමතුම් වල තොරතුරු පහත පරිදි වේ.

| මාසය | ඇමතුම් සංඛ්‍යාව |
|---|---|
| මාර්තු | 44 |
| අප්‍රේල් | 21 |
| මැයි | 48 |
| ජූනි | 56 |
| ජූලි | 361 |
| අගෝස්තු | 268 |
| සැප්තැම්බර් | 52 |
| ඔක්තෝම්බර් | 71 |
| නොවැම්බර් | 185 |
| දෙසැම්බර් | 224 |
| **එකතුව** | **1,330** |



# ප්‍රතිපත්ති හා වැඩසටහන් අංශය

වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීමේ යාන්ත්‍රණය සවිබල ගැන්වීම සඳහා එක්සත් ජාතීන්ගේ සංවර්ධන අරමුදල (UNDP) රුපියල් මිලියන 40 ක ප්‍රදානයක් 2018දී ලබා දුන් අතර එයින් රුපියල් මිලියන 13.2ක් වූ ඉතිරිව තිබූ මුදල 2019 වර්ෂයේ දැනුවත් කිරීමේ වැඩසටහන් සඳහා යොදා ගනු ලැබිණ. ඒ අනුව අධිකාරියේ ප්‍රතිපත්ති හා වැඩසටහන් අංශය යටතේ පහත පරිදි දැනුවත් කිරීමේ වැඩසටහන් සාර්ථකව නිම කරන ලදී.

එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන විසින් ජාතික අධිකාරිය වෙත ලබා දුන් මූල්‍ය ප්‍රධානයන් භාවිතා කර පවත්වන ලද දැනුවත් කිරීමේ වැඩසටහන් පහත පරිදි වේ.

| වැඩමුළුවේ නම | පැවැත්වූ දිනයන් | සහභාගී වූ ගණන | ස්ථානය |
|---|---|---|---|
| 1. අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරියේ නිලධාරීන් සහ සහායක සහ ආරක්ෂක කොට්ඨාසයේ නිලධාරීන් පුහුණු කිරීම | 28.01.2019 - 29.01.2019 | 55 | බණ්ඩාරනායක ජාත්‍යන්තර අනුස්මරණ සම්මන්ත්‍රණ ශාලාව |
| 2. ළමා ආරක්ෂක නිලධාරීන් දැනුවත් කිරීම | 07.02.2019 - 08.02.2019 | 60 | බණ්ඩාරනායක ජාත්‍යන්තර අනුස්මරණ සම්මන්ත්‍රණ ශාලාව |
| 3. පොලිස් විශේෂ විමර්ශන ඒකකය - I කණ්ඩායම | 15.02.2019 - 16.02.2019 | 65 | බණ්ඩාරනායක ජාත්‍යන්තර අනුස්මරණ සම්මන්ත්‍රණ ශාලාව |
| 4. පොලිස් විශේෂ විමර්ශන ඒකකය - II කණ්ඩායම | 26.02.2019 - 27.02.2019 | 55 | බණ්ඩාරනායක ජාත්‍යන්තර අනුස්මරණ සම්මන්ත්‍රණ ශාලාව |
| 5. ශ්‍රී ලංකා නීතිඥ සංගමය - යාපනය | 02.03.2019 | 65 | යූ.එස්. හෝටලය, යාපනය |
| 6. නීතිපති දෙපාර්තමේන්තුවේ රජයේ අධිනීතිඥවරුන් දැනුවත් කිරීම | 09.03.2019 - 10.03.2019 | 100 | බණ්ඩාරනායක ජාත්‍යන්තර අනුස්මරණ සම්මන්ත්‍රණ ශාලාව |
| 7. නීතිඥ සංගමයේ නීතිඥවරුන් දැනුවත් කිරීම | 16.03.2019 | 65 | ශ්‍රී ලංකා පදනම් ආයතනය |
| 8. සිවිල් සංවිධාන ආයතන දැනුවත් කිරීම | 21.03.2019 | 30 | බණ්ඩාරනායක ජාත්‍යන්තර අනුස්මරණ සම්මන්ත්‍රණ ශාලාව |
| 9. අධ්‍යාපන අමාත්‍යාංශයේ කලාප අධ්‍යාපන නිලධාරීන් දැනුවත් කිරීම | 04.04.2019 | 50 | බණ්ඩාරනායක ජාත්‍යන්තර අනුස්මරණ සම්මන්ත්‍රණ ශාලාව |
| 10. බස්නාහිර පළාත් අපරාධ හා සුළු අපරාධ ස්ථානාධිපතිවරුන් දැනුවත් කිරීම - I කණ්ඩායම | 10.04.2019 - 11.04.2019 | 110 | බණ්ඩාරනායක ජාත්‍යන්තර අනුස්මරණ සම්මන්ත්‍රණ ශාලාව |
| 11. හම්බන්තොට දිස්ත්‍රික් රාජ්‍ය නිලධාරීන් දැනුවත් කිරීම | 13.06.2019 | 1500 | හම්බන්තොට රුහුණු මාගම්පුර ප්‍රදර්ශන හා සම්මේලන මධ්‍යස්ථානය |

| | | | |
|---|---|---|---|
| 12. ගාල්ල දිස්ත්‍රික් රාජ්‍ය නිලධාරීන් දැනුවති කිරීම | 27.06.2019 | 800 | ගාල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය |
| 13. අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරියට සහ සහායක සහ ආරක්ෂක කොට්ඨාසයට අළුතින් බඳවා ගත් නිලධාරීන් දැනුවත් කිරීම | 29.10.2019 | 50 | අධිකරණමය නොවන නිලධාරීන් පුහුණු කිරීමේ මධ්‍යස්ථානය, බත්තරමුල්ල |

එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනේ (UNDP) ඍජු ආධාර මත ජාතික අධිකාරිය සංවිධානය කරන ලද පුහුණු වැඩසටහන් පහත පරිදි වේ.

| වැඩමුළුවේ නම | පැවැත් වූ දිනයන් | සහභාගී වූ ගණන | ස්ථානය |
|---|---|---|---|
| 1. පරිවාස හා ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරීන් දැනුවත් කිරීම | 19.12.2019 | 60 | ඕසෝ හෝටලය, කොළඹ 04. |
| 2. බස්නාහිර පළාත් අපරාධ හා සුළු අපරාධ ස්ථානාධිපතිවරුන් දැනුවත් කිරීම - I කණ්ඩායම | 20.12.2019, 21.12.2019 | 110 | බත්තරමුල්ල වෝටර්ස් එඩ්ජ් හෝටලය |
| 3. බස්නාහිර පළාත් කාන්තා හා ළමා ආරක්ෂක නිලධාරිනියන් දැනුවත් කිරිම | 27.12.2019, 28.12.2019 | 110 | ටාජ් සමුද්‍ර හෝටලය, කොළඹ. |

මීට අමතරව එක්සත් ජාතීන්ගේ ළමා අරමුදලේ (Unicef) මඟින් ඍජුවම ආධාර ලබා දී අප සංවිධානය කරන ලද වැඩමුළුවක් පවත්වන ලදී. එහි විස්තර පහත පරිදි වේ.

| වැඩමුළුවේ නම | පැවැත් වූ දිනයන් | සහභාගී වූ ගණන | ස්ථානය |
|---|---|---|---|
| ළමා වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් නිලධාරීන් දැනුවත් කිරීම | 16.08.2019 | 45 | බණ්ඩාරනායක ජාත්‍යන්තර අනුස්මරණ සම්මන්ත්‍රණ ශාලාව |

ප්‍රදර්ශනයකට සමගාමීව සිසුන් සහ මහජනතාව දැනුවත් කිරීමේ විස්තර පහත පරිදි වේ.

| වැඩමුළුවේ නම | පැවැත්වූ දිනයන් | සහභාගී වූ ගණන | ස්ථානය |
|---|---|---|---|
| තම්මැන්නාව වේළුසුමන මහා විද්‍යාලයේ ප්‍රදර්ශනයට සමගාමීව සිසුන් සහ මහජනතාව දැනුවත් කිරීම | 11.10.2019-13.10.2019 | පාසල් ළමුන් 10,000, ගුරුවරුන් 600ක් සහ දෙමාපියන් 1000 ක් | තම්මැන්නාම වේළුසුමන මහා විද්‍යාලය |

- ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් (Transparency International) මගින් අපරාධ වින්දිතයන් ආරක්ෂා කිරීමේ හා සාක්ෂිකරුවන්ට සහය දීමේ පනත හා ඔවුන්ගේ අයිතිවාසිකම් හා හිමිකම් අන්තර්ගත කරමින් මුද්‍රණය කරන ලද පෝස්ටර් 1000ක් 2019 වර්ෂයේ සපයන ලදී.
- එක්සත් ජාතීන්ගේ අනුග්‍රහය යටතේ මුද්‍රණය කරන ලද පෝස්ටර් දිවයිනේ සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන් (25), ප්‍රාදේශීය ලේකම්වරුන් (331) සහ ජාතික පාසල් (353) සඳහා බෙදා හැරීම සිදු කරන ලදී. මෙම පෝස්ටර් කාර්යාල පරිශ්‍රයඹි දැන්වීම් පුවරු වල ප්‍රදර්ශනය කිරිමට කටයුතු කරන ලදී.

- මහජනයා දැනුවත් කිරීමේ ව්‍යාපාරය දියත් කෙරිණි. පෝස්ටර් සහ වීඩියෝ සහ ගුවන්විදුලි ක්ලිප් නිෂ්පාදනය කර රූපවාහිනී / ගුවන් විදුලි නාලිකා වල මසක කාලයක් ප්‍රචාරය කරන ලදී.
- හොරොවුපතාන තම්මැන්නාව වේළුසුමන මහ විද්‍යාලයේ පැවති අධ්‍යාපනික ප්‍රදර්ශනයට සමගාමීව අප ආයතනයෙන් ප්‍රදර්ශන කුටියක් ස්ථාපිත කොට 2019 ඔක්තෝම්බර් 9 සිට 11 දක්වා ඒ අවට පාසල් ගුරුවරුන් 600ක් සිසුන් 10000ක් දෙමවුපියන් 1000ක් දැනුවත් කිරීම සිදුකරන ලදී. මෙම ප්‍රදේශය ළමා අපයෝජන වැඩි වශයෙන් සිදුවීමේ අවධානමක් සහිත බැවින් මේ සඳහා අප ආයතනයේ ප්‍රමුඛතාවය හිමිවිය. එහිදී පෝස්ටර් 254ක් අවට පාසල් පරිශ්‍රයහි දැන්වීම් පුවරු වල ප්‍රදර්ශනය කිරි සඳහා බෙදා දෙන ලදී.
- අප ආයතනය විසින් සකස් කරන ලද පෝස්ටර් දිවයිනේ අධිකරණ පරිශ්‍රයන් 205ක දැන්වීම් පුවරු වල ප්‍රදර්ශනය කිරීම උදෙසා ලබා දෙන ලදී.
- UNDP, Unicef, ට්‍රාන්ස්පේරන්සි ඉන්ටර්නැෂනල්, Victim Support Asia (VSA) ජාලය, UNODC, UNOCT පර්යේෂණ ජාල සමඟ අන්තර් ක්‍රියා කිරීම සහ ජාත්‍යන්තරව දැනුවත් කිරීම කරන ලදී.

**අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරියේ මාණ්ඩලික නිලධාරීන් සහ සහායක සහ ආරක්ෂක කොට්ඨාසයේ නිලධාරීන් පුහුණු කිරීම**

දිනය - 2019.01.28-2019.01.29

ස්ථානය - බණ්ඩාරනායක ජාත්‍යන්තර අනුස්මරණ සම්මන්ත්‍රණ ශාලාව නිලධාරීන් සංඛ්‍යාව - 55













ළමා ආරක්ෂක නිලධාරීන් දැනුවත් කිරීම

දිනය - 2019.02.07 -2019.02.08

ස්ථානය - බණ්ඩාරනායක ජාත්‍යන්තර අනුස්මරණ සම්මන්ත්‍රණ ශාලාව

නිලධාරීන් සංඛ්‍යාව - 60








### පොලිස් විශේෂ විමර්ශන ඒකකය- I කණ්ඩායම

දිනය - 2019.02.15 - 2019.02.08

ස්ථානය - බණ්ඩාරනායක ජාත්‍යන්තර අනුස්මරණ සම්මන්ත්‍රණ ශාලාව     නිලධාරීන් සංඛ්‍යාව - 65





















### පොලිස් විශේෂ විමර්ශන ඒකකය- II කණ්ඩායම

දිනය - 2019.02.26 – 2019.02.27

ස්ථානය - බණ්ඩාරනායක ජාත්‍යන්තර අනුස්මරණ සම්මන්ත්‍රණ ශාලාව     නිලධාරීන් සංඛ්‍යාව - 55

















**ශ්‍රී ලංකා නීතිඥවරුන්ගේ සංගමය දැනුවත් කිරීම-යාපනය**

දිනය - 2019.03.02

ස්ථානය - යූ.එස්. හෝටලය, යාපනය නිලධාරීන් සංඛ්‍යාව - 65










**නීතිපති දෙපාර්තමේන්තුවේ රජයේ අධිනීතිඥවරුන් දැනුවත් කිරීම**

දිනය - 2019.03.09- 2019.03.10

ස්ථානය - බණ්ඩාරනායක ජාත්‍යන්තර අනුස්මරණ සම්මන්ත්‍රණ ශාලාව

නිලධාරීන් සංඛ්‍යාව - 100













**අධ්‍යාපන අමාත්‍යාංශයේ කළාප අධ්‍යාපන නිලධාරීන් දැනුවත් කිරීම**

දිනය - 2019.04.04

ස්ථානය - බණ්ඩාරනායක ජාත්‍යන්තර අනුස්මරණ සම්මන්ත්‍රණ ශාලාව නිලධාරීන් සංඛ්‍යාව - 50











**බස්නාහිර පළාත් අපරාධ හා සුළු අපරාධ ස්ථානාධිපතිවරුන් දැනුවත් කිරීම- I කණ්ඩායම**

දිනය - 2019.04.10 – 2019.04.11

ස්ථානය - බණ්ඩාරනායක ජාත්‍යන්තර අනුස්මරණ සම්මන්ත්‍රණ ශාලාව නිලධාරීන් සංඛ්‍යාව - 110













**හම්බන්තොට දිස්ත්‍රික් රාජ්‍ය නිලධාරීන් දැනුවත් කිරීම**

දිනය - 2019.06.13
ස්ථානය - හම්බන්තොට රුහුණු මාගම්පුර ප්‍රදර්ශන හා සම්මේලන මධ්‍යස්ථානය නිලධාරීන් සංඛ්‍යාව - 1500










## ගාල්ල දිස්ත්‍රික් රාජ්‍ය නිලධාරීන් දැනුවත් කිරීම

දිනය - 2019.06.27

ස්ථානය - ගාල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය නිලධාරීන් සංඛ්‍යාව - 800









## අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරියට සහ සහයක සහ ආරක්ෂක කොට්ඨාසයට අළුතින් බඳවා ගත් නිලධාරීන් දැනුවත් කිරීම

දිනය - 2019.10.29

ස්ථානය - අධිකරණමය නොවන නිලධාරීන් පුහුණු කිරීමේ මධ්‍යස්ථානය, බත්තරමුල්ල

නිලධාරීන් සංඛ්‍යාව - 50










**පරිවාස හා ළමා හිමිකම් ප්‍රවර්ධන නිළධාරීන් දැනුවත් කිරීම**

දිනය - 2019.12.19

ස්ථානය - ඔසෝ හෝටලය, කොළඹ 04. නිලධාරීන් සංඛ්‍යාව - 60













**බස්නාහිර පළාත් අපරාධ හා සුළු අපරාධ ස්ථානාධිපතිවරුන් දැනුවත් කිරීම- I කණ්ඩායම**


දිනය - 2019.12.20 - 2019.12.21

ස්ථානය - බත්තරමුල්ල වෝටර්ස් ඒඩ්ජ් හෝටලය නිලධාරීන් සංඛ්‍යාව - 110










**බස්නාහිර පළාත් කාන්තා හා ළමා ආරක්ෂක නිළධාරිනියන් දැනුවත් කිරීම**

දිනය - 2019.12.27 – 2019.12.28

ස්ථානය - ටාජ් සමුද්‍ර හෝටලය,කොළඹ. නිලධාරීන් සංඛ්‍යාව - 110









**ළමා වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් නිලධාරීන් දැනුවත් කිරීම**

දිනය - 2019.08.16

ස්ථානය - බණ්ඩාරනායක ජාත්‍යන්තර අනුස්මරණ සම්මන්ත්‍රණ ශාලාව නිලධාරීන් සංඛ්‍යාව - 45






**තම්මැන්නාව වේළුසුමන මහා විද්‍යාලයේ ප්‍රදර්ශනයට සමගාමීව සිසුන් සහ මහජනතාව දැනුවත් කිරීම**

දිනය - 2019.10.11 – 2019.10.13 ස්ථානය - තම්මැන්නාව වේළුසුමන මහා විද්‍යාලය

සහභාගී වූ ගනන -පාසල් ළමුන් 10000 ගුරුවරුන් 600ක් සහ දෙමවුපියන් 1000ක්






# මූල්‍ය අංශය

# 2019.01.01 සිට 2019.12.31 දක්වා මූල්‍ය ප්‍රගතිය

| විස්තරය | 2019 වර්ෂය සඳහා ප්‍රතිපාදන (රු.මි.) | 2019 වරෂය සඳහා සංතශෝධිත ප්‍රතිපාදන (රු.මි.) | 2019.12.31 දිනට වියදම (රු.මි.) | 2019.12.31 දිනට මූල්‍ය ප්‍රගතිය |
|---|---|---|---|---|
| (a) | (b) | (c) | (d) | (e) = (d)/(c)*10 |
| රජයේ පුනරාවර්තන වියදම | 60.0 | 43.0 | 37.93 | 88% |
| රජයේ ප්‍රාග්ධන වියදම | 15.0 | 15.0 | 9.49 | 63% |
| UNDP අරමුදලින් කළ වියදම | 13.2 | 13.2 | 13.20 | 100% |
| එකතුව | **88.2** | **71.2** | **60.62** | **85%** |

# 2019.12.31න් අවසන් වන වසර සඳහා වන මූල්‍ය ප්‍රකාශනවලට සටහන්

## ගිණුම්කරණ ප්‍රතිපත්ති

### 1. සංස්ථානික තොරතුරු

#### 1.1. ස්ථාපිත කිරීම හා නෛතික පසුබිම

2015 අංක 04 දරන අපරාධයක වින්දිතයන් හා සාක්ෂිකරුවන්හට සහාය දීමේ හා ආරක්ෂා කිරීමේ පනත මගින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව මගින් අපරාධයක වින්දිතයන් හා සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වන ජාතික අධිකාරිය ස්ථාපිත කරන ලද අතර, අධිකරණ අමාත්‍යංශය යටතේ එහි සේවා සැපයෙන ක්ෂේත්‍රය පුළුල් කෙරිණි. එහි ප්‍රධාන කාර්යාලය පළමු මහළ, 428/11ඒ, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල යන ස්ථානයේ පිහිටා ඇත.

#### 1.2 ප්‍රධාන කාර්යයන් හා මෙහෙයුම් කටයුතුවල ස්වභාවය

පනතෙහි අරමුණු ළඟා කර ගැනීමට අදාළව අධිකාරියේ රාජකාරි හා කාර්යයන් 2015 අංක 04 දරන අපරාධයක වින්දිතයන් හා සාක්ෂිකරුවන් හට සහාය දීමේ හා ආරක්ෂා කිරීමේ පනතෙහි 13 වන වගන්තිය යටතේ ලැයිස්තුගත කර ඇත.

#### 1.3 සේවකයන් සංඛ්‍යාව

2019 වසර අවසන් වන විට සේවක සංඛ්‍යාව 38ක් විය.

### 2 සැකසීමේ පදනම

#### 2.1 අනුකූලතා ප්‍රකාශනය

අපරාධයක වින්දිතයන් හා සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වන ජාතික අධිකාරියෙහි මූල්‍ය ප්‍රකාශනය, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, සංචිත වෙනස්වීම හා මූල්‍ය ප්‍රකාශන සඳහා වන සටහන් ආදියෙන් සමන්විත වේ. මෙම ප්‍රකාශන ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය මගින් දක්වා ඇති ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සකස් කරනු ලැබේ.

#### 2.2. ඇගයීමේ පදනම

මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය පදනම මත සකස් කරන ලදී.

මූල්‍ය ප්‍රකාශනවල උද්ධමනීය සාධක සඳහා කිසිදු ගැලපුමක් නොකරන ලදී.

2.2 **කෘත්‍යාත්මක මුදල්**

අපරාධයක වින්දිතයන් හා සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වන ජාතික අධිකාරියේ කෘත්‍යාත්මක මුදල් වන ශ්‍රී ලංකා රුපියල් වලින් මෙම මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කෙරේ.

## 3 වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති

පහත දක්වා ඇති මෙම ගිණුම්කරණ ප්‍රතිපත්ති මෙම මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කර ඇති සියලු කාල සීමාවන් සඳහා නිත්‍ය වශයෙන් අදාළ කර ගන්නා ලදී.

### 3.1. දේපළ, පිරියත හා උපකරණ

දේපළ, පිරියත හා උපකරණවලට අදාළ පිරිවැය යනු අත්පත් කර ගැනීමේ හෝ ඉදිකිරීමේ පිරිවැය සහ අපේක්ෂිත භාවිතය සඳහා අදාළ වත්කම ක්‍රියාත්මක තත්ත්වයට පත් කිරීමේ දී දැරීමට වන වියදම වේ. මූලිකව වත්කම පිරිවැයට හඳුනා ගැනීමෙන් පසුව ප්‍රත්‍යාගණනයට ලක් කළ වත්කම් ඉන් පසු ක්ෂය අඩු කිරීමෙන් අනතුරුව වන ප්‍රත්‍යාගණනය කරන ලද අගය මත පවත්වාගෙන යනු ලැබේ. අනෙක් සියළු දේපළ, පිරියත හා උපකරණ සමුච්චිත ක්ෂය අඩු කිරීමෙන් පසු පිරිවැයට පෙන්වනු ලැබේ. දේපළ, පිරියත හා උපකරණවල අයිතමයක් විවිධ ප්‍රයෝජනවත් ජීවකාලයන් සහිත සංරචකවලින් යුක්ත වන විට ඒවා දේපළ, පිරියත හා උපකරණවල තනි අයිතම සඳහා අදාළ කර ගනු ලැබේ.

එක් එක් මුදල් වර්ෂය අවසානයේ වත්කමෙහි ශේෂ අගයන්, ප්‍රයෝජනවත් ජීව කාල හා ක්ෂය වීමේ ක්‍රම සමාලෝචනය කර යෝග්‍ය නම් ගලපනු ලැබේ.

### ප්‍රදානයන් ලෙස ලද දේපළ, පිරියත හා උපකරණ

ඕනෑම ප්‍රදානයක් යටතේ අත්පත් කර ගත් දේපළ, පිරියත හා උපකරණයක පිරිවැයට ප්‍රාග්ධනිත කෙරේ.

සින්නක්කර ඉඩම් හැර අනෙක් සියළු දේපළ, පිරියත හා උපකරණ සමුච්චිත ක්ෂය අඩු කිරීමෙන් පසු පිරිවැයට පෙන්වනු ලැබේ. සින්නක්කර ඉඩම් පිරිවැයට පෙන්වනු ලැබේ.

සින්නක්කර ඉඩම් හැර සියලු දේපළ, පිරියත හා උපකරණ මත ක්ෂය ගණනය කරනු ලබන්නේ ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ජීවිත කාලය පුරාවට පිරිවැය කපා හැරීම සඳහා ය.

වසර සඳහා ක්ෂය වෙන් කරන ලද්දේ සමානුපාතික පදනම මත ය.

පහත දක්වා ඇති පරිදි දේපළ, පිරියත හා උපකරණ ක්ෂය කරනු ලබන්නේ සියලු මාර්ග ක්‍රමය මත යි. තවද සියළු දේපළ, පිරියත හා උපකරණ **SLPSAS 7** - දේපළ, පිරියත හා උපකරණ යටතේ දක්වා ඇති පිරිවැය ක්‍රමය මත ගිණුම් තබන ලදී.

| | | |
|---|---|---|
| 1. | මෝටර් රථ | 20% |
| 2. | පිරියත හා යන්ත්‍රෝපකරණ | 25% |
| 3. | පරිගණක හා උපාංග | 25% |
| 4. | ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ | 10% |
| 5. | ගොඩනැගිලි | 4% |
| 6. | මෘදුකාංග | 25% |
| 7. | වෙනත් | 10% |

දේපළ, පිරියත හා උපකරණවලට අයත් අයිතමයක් ඉවත් කරනු ලබන්නේ බැහැර කිරීමේ දී හෝ එහි භාවිතය හෝ බැහැර කිරීම තුළින් කිසිදු අනාගත ආර්ථික ප්‍රතිලාභයක් අපේක්ෂා නොකරන අවස්ථාවකදී ය. වත්කමක් ඉවත් කිරීමේ දී සිදු වන ලාභයක් හෝ පාඩුවක් (ඉවත් කිරීම්වලින් ශුද්ධ ලැබෙන මුදල හා වත්කම දරන ලද අගය අතර වෙනස ලෙස ගණනය කළ) වත්කම ඉවත් කරන වසරෙහි ආදායම් ප්‍රකාශනයට ඇතුළත් කරනු ලැබේ.

මූලිකව තක්සේරු කරන ලද කාර්යසාධන ප්‍රමිති මගින් අපේක්ෂිත අනාගත ආර්ථික ප්‍රතිලාභ පවත්වාගෙන යාමේ අරමුණින් දේපළ, පිරියත හා උපකරණ‍ව අළුත්වැඩියා කිරීම හෝ නඩත්තුව සඳහා වන වියදම එය ඇති වූ අවස්ථාවේ දී වියදමක් ලෙස හඳුනා ගනු ලැබේ.

### 3.2 **භාණ්ඩ තොගය**

මූල්‍ය වර්ෂය තුළ භාවිතා කරනු ලබන භාණ්ඩ තොගය ආදායම් හා වියදම් ප්‍රකාශනයේ පිරිවැයට අගය කර ඇත.

පිරිවැය, විකුණුම් මිළ හෝ ශුද්ධ උපලබ්ධි අගය යන තුනෙන් වඩා අඩු අගය මත ඉතිරි භාණ්ඩ තොගය අගය කරනු ලැබේ.

### 3.3. මුදල් සහ මුදල් සමාන දෑ

මුදල් සහ මුදල් සමාන දෑ, අතැති මුදල් හා බැංකුවෙහි ඇති මුදල්වලින් සමන්විත වේ.

### 3.4. මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

වක්‍ර ක්‍රමය භාවිතා කරමින් මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සකස් කරන ලදී.

### 3.5. වගකීම් හා වෙන් කිරීම්

පසුගිය සිදුවීම්වල ප්‍රතිඵලයක් ලෙස වර්තමාන බැඳීමක් ඇති විට ශේෂ පත්‍රයෙහි වගකීම් හඳුනා ගනු ලබන අතර එය නිරවුල් කිරීමේ දී ආර්ථික ප්‍රතිලාභ සහිත සම්පත් ගලා යාමක් සිදු වෙතැයි අපේක්ෂා කෙරේ. ණය හිමියන්ගේ ඉල්ලීම මත හෝ ශේෂ පත්‍රයේ දිනයේ සිට වසකර කාලයක් තුළ පියවිය හැකි බැඳීම් ශේෂ පත්‍රයෙහි ජංගම වගකීම් ලෙස සලකනු ලැබේ.

පසුගිය සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස අපරාධයක වින්දිතයන් හා සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වන ජාතික අධිකාරියට විශ්වසනීය ලෙස ඇස්තමේන්තුගත කළ හැකි වර්තමාන නෛතික හෝ වැඩදායී බැඳීමක් වේ නම් හා අදාළ බැඳීම පියවීම සඳහා ආර්ථික ප්‍රතිලාභ ගලා යාමක් අවශ්‍ය වේ නම් වෙන්කිරීම් හඳුනා ගත හැකිය.

### 3.6. බදුකරණය

බදු වියදම් මූල්‍ය ප්‍රකාශනයේ සටහන් කර ඇති අතර 2017 අංක 24 දරණ දේශීය ආදායම් පනතෙහි සහ එහි සංශෝධනවල විධිවිධානවලට අනුව ගණනය කර ඇත.

### 3.7. සේවක ප්‍රතිලාභ

### I. නිර්වාචිත දායකත්ව සැලැස්ම

නිර්වාචිත දායකත්ව සැලැස්ම පිළිබඳ බැඳීම සිදු කළ වියදමක් ලෙස ආදායම් ප්‍රකාශනයේ හඳුනා ගැනේ. අපරාධයක වින්දිතයන් හා සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වන ජාතික අධිකාරිය මගින් අර්ථසාධක අරමුදල හා සේවක භාර අරමුදල වෙත සේවකයන්ගේ දළ වැටුපෙන් පිළිවෙලින් 12% හා 3% දායකත්වයක් දරනු ලැබේ.

### II. නිර්වාචිත ප්‍රතිලාභ සැලැස්ම අර්ථ දැක්වීම

පාරිතෝෂිකය යනු නිර්වාචික ප්‍රතිලාභ සැලැස්මකි. අදාළ නීතිය අනුව පාරිතෝෂිකය ගෙවීමට අපරාධයක වින්දිතයන් හා සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වන ජාතික අධිකාරිය බැඳී සිටියි. මෙම වගකීම ඉටු කිරීම සඳහා සේවය කළ පළමු වසරින් ආරම්භ කර සේවා කාලයෙහි සම්පූර්ණ කරන එක් එක් වසර සඳහා සියළු ම සේවකයන්ගේ පසුගිය මුදල් වර්ෂයෙහි අවසන් වරට ලබා ගත් අඩ මසක වැටුප මත පදනම්ව ගණනය කරන මුදලට සමාන ප්‍රතිපාදනයක් ශේෂ පත්‍රයෙහි ඉදිරියට ගෙන එනු ලැබේ.

1993 අංක 12 දරන පාරිතෝෂිකය ගෙවීමේ පනත යටතේ ගෙවිය හැකි පාරිතෝෂිකයට අදාළව සියළු සේවකයන් සඳහා විශ්‍රාමික පාරිතෝෂිකය සඳහා ප්‍රතිපාදන වෙන් කෙරේ. මෙම අයිතමය ශේෂ පත්‍රයෙහි ජංගම නොවන වගකීම් යටතේ කාණ්ඩ ගත කෙරේ.

මහා භාණ්ඩාගාරයට අනුව ඔවුන් අවශ්‍ය වූ විට අරමුදල් පිරිනමන බැවින් මේ සඳහා අරමුදලක් අවශ්‍ය නොවේ.

### 3.8. අධිකාරියේ අරමුදල්

පනතෙහි 18 හා 29 වන වගන්තීන් ප්‍රකාරව අරමුදල් දෙකක් (2) අධිකාරිය සතුවේ.

1. අධිකාරියේ අරමුදල

   මෙම අරමුදල සඳහා පහත අයුරින් මුදල් බැර කළ යුතුය.
   - අධිකාරියේ ප්‍රයෝජනය සඳහා පාර්ලිමේන්තුව විසින් වරින් වර සම්මත කෙරෙන සියලුම මුදල්
   හා
   -පරිත්‍යාගයන්, ත්‍යාග, පැවරීම් හා ප්‍රදානයන් ලෙස ශ්‍රී ලංකාව තුළ හා ඉන් පිටත මූලාශ්‍රයන්ගෙන් ලැබෙන අධිකාරිය වෙත ලැබෙන සියලු මුදල්.

   පනත යටතේ අධිකාරියේ රාජකාරි හා කාර්යයන් ඉටු කිරීමේ දී සිදු වන වියදම් අධිකාරියේ අරමුදලින් ගෙවිය යුත්තේ ය.

2. ආරක්ෂක අරමුදල

   ආරක්ෂක අරමුදල සඳහා මුදල් බැර කිරීම පහත පරිදි සිදු කළ යුත්තේ ය.

   -අරමුදල සඳහා පාර්ලිමේන්තුව විසින් සම්මත කෙරෙන සියලු මුදල්;

- පරිත්‍යාගයන්, ත්‍යාග, පැවරීම් හා ප්‍රදානයන් ලෙස දේශීය හා විදේශීය මූලාශ්‍රයන්ගෙන් අධිකාරිය වෙත ලැබෙන ආරක්ෂක අරමුදල වෙත ප්‍රේෂණය කිරීමට නියමිත සියලු මුදල්.

-28 වන වගන්තියෙහි (1) (අ) (ii) උප වගන්ති යටතේ අධිකරණය විසින් ප්‍රේෂණය කෙරෙන සියලු මුදල්.

29 වන වගන්තියෙහි (4) (අ) හා (ආ) උප වගන්ති යටතේ වන ගෙවීම් සඳහා මණ්ඩලය විසින් තීරණය කරනු ලබන ආකාරයට ආරක්ෂක අරමුදලින් ගෙවීම් සිදු කෙරේ.

## 3.9. ආදායම හඳුනාගැනීම

### 3.9.1 ආදායම හඳුනාගැනීම

වන වගන්තියෙහි (1) (අ) (ii) උප වගන්ති යටතේ අධිකරණය විසින් ප්‍රේෂණය කෙරෙන සියලු මුදල් ලැබීමේ පදනම මත ගණනය කරනු ලබන අතර පොළිය හා වෙනත් සියලු ආදායම් උපචිත පදනම මත ගණනය කෙරේ.

### 3.9.2 වියදම

මණ්ඩලය පවත්වාගෙන යාමේ දී දරන ලද සියලු වියදම් උපචිත පදනම මත ගණනය කරන ලද අතර මණ්ඩලයේ ඉපයීමේ ධාරිතාව පවත්වාගෙන යාම හෝ ඉහළ නැංවීම සඳහා ස්ථාවර ස්වභාවයේ වත්කම් අත්පත් කරගැනීම, ව්‍යාප්ත කිරීම හෝ සංවර්ධනය කිරීමට අදාළව දරන ලද සියලු වියදම් ප්‍රාග්ධන වියදම් ලෙස සලකනු ලැබීය.

## 3.10. සංසන්දනාත්මක තොරතුරු

අවශ්‍ය වූ විට වර්තමාන වසරේ ඉදිරිපත් කිරීමට අනුකූල වන පරිදි සංසන්දනාත්මක සංඛ්‍යාවන් යළි සකස් කරන ලදී.

## 3.11. ශේෂ පත්‍ර දිනයට පසු සිදුවීම්

ශේෂ පත්‍රයට පෙර සියළු සිදුවීම් සලකා බලන ලද අතර යෝග්‍ය අවස්ථාවල දී මූල්‍ය ප්‍රකාශනයට අදාළව ගැලපීම් හෝ අනාවරණයන් සිදු කරන ලදී.

## 3.12. වගකීම් හා අවිනිශ්චිතතාවන්

අවිනිශ්චිතතාවන් යනු පසුගිය සිදුවීම්වලට අදාළ වත්කම් හෝ බැදීම් වන අතර මණ්ඩලයේ පාලනයෙන් ඔබ්බට වන අවිනිශ්චිත අනාගත සිදුවීම් ඇති වීම හෝ ඇති නොවීම මත තහවුරු කරනු ලැබේ.

## 3.13. ප්‍රදානයන් ගිණුම්ගත කිරීම

**i.** රාජ්‍ය ප්‍රදානයන්

ඉදිරිපත් කිරීමේ ක්‍රම ඇතුළු රාජ්‍ය ප්‍රදානයන් සඳහා භාවිතා කරන ගිණුම්කරණ ප්‍රතිපත්තිය පහත පරිදි වේ.

අ. වත්කම් මිළ දී ගැනීම සඳහා වන රාජ්‍ය ප්‍රදානයන් වත්කම්වල ප්‍රයෝජනවත් ජීවිත කාලය පුරාවට ආදායමක් ලෙස හඳුනාගනු ලැබේ.

ආ. ලැබෙන වෙනත් ප්‍රදානයන් මෙන් ම ඉන් පසු සිදුව ඇති වන වියදම් ලාභ හා පාඩුවල ඇතුළත් කරන ලදී.

## 3.14. ආයෝජනය

යෝග්‍ය හා ආරක්ෂිත ආකාරයට එහි අරමුදල වෙත බැර කර ඇති මුදල් ආයෝජනය කිරීම, බැංකුවෙහි ජංගම, ඉතුරුම් හො තැන්පතු ගිණුම් විවෘත කිරීම හා පවත්වාගෙන යාම පිළිබඳ 14 වන වගන්තියෙහි (ආ) උප වගන්තිය යටතේ විස්තර කෙරේ.

පනතට අනුකූල වන පරිදි එහි අරමුදලට බැර කරන ලද මුදල් යෝග්‍ය හා ආරක්ෂිත ආකාරයට මූල්‍ය උපකරණවල ආයෝජනය කරනු ලැබේ. එම ආයෝජන පිරිවැය පදනම මත ගිණුම්ගත කරනු ලබන අතර එවැනි ආයෝජන මගින් උපයන ආදායම උපචිත පදනම මත ගිණුම්ගත කරනු ලැබේ.

**2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය**

| | සටහන් අංක | 2019 රුපියල් | 2018 රුපියල් |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| **ජංගම වත්කම්** | | | |
| අතැති මුදල් හා බැංකුවෙහි ඇති මුදල් | **08** | 4,749,968 | 555,800 |
| බැරකම් | **09** | 30,000 | 15,000 |
| අනෙකුත් වත්කම් | **10** | 1,578,031 | 1,159,720 |
| **මුළු ජංගම වත්කම්** | | **6,357,999** | **1,730,520** |
| **ජංගම නොවන වත්කම්** | | | |
| **ආයෝජන** | **11** | 2,163,300 | |
| දේපළ, පිරියත හා උපකරණ | **12** | 19,657,940 | 15,482,742 |
| **මුළු ජංගම නොවන වත්කම්** | | **21,821,240** | **15,482,742** |
| **මුළු වත්කම්** | | **28,179,239** | **17,213,262** |
| අඩු කළා: | | | |
| **වගකීම්** | | | |
| **ජංගම වගකීම්** | **13** | **1.238,653** | **246,514** |
| **මුළු ජංගම වගකීම්** | | **1.238,653** | **246,514** |
| **ශුද්ධ ජංගම වත්කම්** | | **5,119,347** | **1,484,005** |
| **ජංගම නොවන වගකීම්** | **14** | **1,033,949** | **440,404** |
| **මුළු වගකීම්** | | **2,272,601** | **686,919** |
| **මුළු ශුද්ධ වත්කම්** | | **25,906,638** | **16,526,343** |
| **මූල්‍යනය සිදු කළේ පහත ආකාරයටයි** | | | |
| සමුච්චිත අරමුදල | **15** | 566 | 487,801 |
| **අධිකාරියේ ආරක්ෂණ අරමුදල** | **16** | 3,963,140 | 555,800 |
| රාජ්‍ය ප්‍රදානයන් | **17** | 14,806,284 | 8,139,968 |
| UNDP ප්‍රදානයන් | **18** | 6,105,648 | 7,342,774 |
| | | **25,906,638** | **16,526,343** |

"පිටු අංක 1- 5 දක්වා වන ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ, පිටු අංක 10 සිට 15 දක්වා වන සටහන්, මෙම මූල්‍ය ප්‍රකාශයේ වැදගත් කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශයන් කළමනාකරණ මණ්ඩලය වෙනුවෙන්, අධිකරණ, මානව හිමිකම් සහ නීති ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ ලේකම්තුමා විසින් අනුමත කර ඇත."

අත්සන් කලේ:

ජී. ඩී . ආර් . පෙරේරා
අධ්‍යක්ෂ ( මූල්‍ය )

උදයකුමාර අමරසිංහ
අධ්‍යක්ෂ ජනරාල්

අනුමත කලේ:

ජේ.ජේ. රත්නසිරි
ලේකම්
අධිකරණ, මානව හිමිකම් සහ නීති ප්‍රතිසංස්කරණ අමාත්‍යංශය

**අපරාධයක වින්දිතයන්හා සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වන ජාතික අධිකාරිය**
2019 දෙසැම්බර් 31න් අවසන් වන වසරෙහි මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය

| | සටහන් අංක | **2019** රුපියල් | **2018** රුපියල් |
|---|---|---|---|
| **ආදායම** | **1** | | |
| ප්‍රදානයන් | **1.1** | 38, 964,130 | 31,181,249 |
| වෙනත් ආදායම් | **1.2** | 18,749,310 | 23,080,227 |
| **මුළු ආදායම** | | **57,713,440** | **54,261,476** |
| **මෙහෙයුම් වියදම්** | | | |
| පුද්ගලික වේතන | **2** | 28,155,264 | 22,659,856 |
| ගමන් වියදම් | **3** | 242,668 | 310,004 |
| සැපයුම් හා පාරිභෝගික භාණ්ඩ | **4** | 4,193,854 | 2,900,051 |
| නඩත්තුව | **5** | 3,458,610 | 3,295,380 |
| ගිවිසුම්ගත සේවාවන් | **6** | 18,400,264 | 23,514,465 |
| ක්ෂය වීම | **7** | 2,719,015 | 1,093,920 |
| **මුළු වියදම්** | | **57,169,675** | **53,773,675** |
| **අදාළ කාල සීමාව අතිරික්තය/ (හිඟය)** | | **543,765** | **487,801** |

අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරිය

2019 දෙසැම්බර් 31න් අවසන් වන වසර සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| | | 2019<br>රුපියල් | 2018<br>රුපියල් |
|---|---|---|---|
| <u>**මෙහෙයුම් කටයුතු මගින් සිදුවන මුදල් ප්‍රවාහය**</u> | | | |
| වසර සඳහා වන අතිරික්තය/ (හිඟය) | | 543,765 | 487,801 |
| අඩු කළා: | ස්ථාවර වත්කම් විකිණීමෙන් ලද ලාභය | - | - |
| | ප්‍රාග්ධන ප්‍රදානය ක්‍රමාක්ෂය කිරීම | (18,500,810) | (1,093,920) |
| එකතු කළා : | වසර සඳහා ක්ෂය වීම | 2,719,015 | 1,093,920 |
| | පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන | 593,544 | 440,404 |
| **කාරක ප්‍රාග්ධනයට පෙර මෙහෙයුම් අතිරික්තය/ (හිඟය)** | | **(14,644,486)** | **928,205** |
| | භාණ්ඩ තොග වැඩිවීම | (365,876) | (1,159,720) |
| | වෙළඳ හා වෙනත් ලැබීම් වැඩි වීම (අඩු වීම) | (52,435) | - |
| | පෙර ගෙවීම් ඉහළ යාම | (15,000) | (15,000) |
| | උපචිත වියදම් හා ගෙවිය හැකි දේ වැඩි වීම | 992,138 | 246,514 |
| | වසර තුළ ගෙවන ලද පාරිතෝෂික | - | - |
| | | **(558,827)** | **(928,205)** |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් මගින් වන ශුද්ධ මුදල් ප්‍රවාහය** | | **(14,085,658)** | **-** |
| **ආයෝජන කටයුතු මගින් වන මුදල් ප්‍රවාහය** | | | |
| | ස්ථාවර වත්කම් මිල දී ගැනීම | (6,894,213) | (13,915,369) |
| | ස්ථාවර වත්කම් විකිණීමෙන් ලබන මුදල් ආයෝජනය | - | - |
| | **ආයෝජන** | (2,163,300) | - |
| **ආයෝජන කටයුතු මගින් වන ශුද්ධ මුදල් ප්‍රවාහය** | | **(9,057,513)** | **(13,915,369)** |
| **මූල්‍ය කටයුතු මගින් වන මුදල් ප්‍රවාහය** | | | |
| | අභ්‍යාන්තර අරමුදල සඳහා ශුද්ධ ලැබීම් | 3,407,340 | 555,800 |
| | ප්‍රාග්ධන ප්‍රදාන | 23,930,000 | 13,915,369 |
| **මූල්‍ය කටයුතු මගින් වන ශුද්ධ මුදල් ප්‍රවාහය** | | **27,337,340** | **14,471,169** |
| **භාවිතා කළ ශුද්ධ මුදල් ප්‍රමාණය** | | **4,194,168** | **555,800** |
| **2019. 01.01 දිනට මුදල් හා මුදල් සමාන දෑ** | | **555,800** | - |
| **2019. 12.31 දිනට මුදල් හා මුදල් සමාන දෑ** | | **4,749,968** | **555,800** |

අපරාධයක වින්දිතයන් හා සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වන ජාතික අධිකාරිය

**2019 දෙසැම්බර් 31 න් අවසන් වූ වසර සඳහා සංචිතයන්හි වෙනස්කම් පිළිබඳ ප්‍රකාශනය**

| | අරමුදල් (රු) | ප්‍රදානයන් (රු) | සමුච්චිත අරමුදල හා සංචිත (රු) | එකතුව (රු) |
|---|---|---|---|---|
| 2018 ජනවාරි 1 දිනට ශේෂය | - | 2,661,292 | - | 2,661,292 |
| වසර තුළ අය කිරීම් | - | 40,939,171 | 487,801 | 41,426,972 |
| වසර තුළ මාරු කිරීම් | 555,800 | (28,117,722) | - | (27,561,922) |
| 2018 දෙසැම්බර් 31 දිනට ශේෂය | **555,800** | **15,482,742** | **487,801** | **16,526,343** |
| 2019 ජනවාරි 1 දිනට ශේෂය | 555,800 | 15,482,742 | 487,801 | 16,526,343 |
| වසර තුළ අය කිරීම් | - | 23,930,000 | 543,765 | 24,473,765 |
| වසර තුළ මාරු කිරීම් | 3,407,340 | (18,500,810) | - | (15,093,470) |
| 2019 දෙසැම්බර් 31 දිනට ශේෂය | **3,963,140** | **20,911,932** | **1,031,566** | **25,906,638** |

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

| 01 සටහන<br>ආදායම | 2019<br>(රු) | 2018<br>(රු) |
|---|---|---|
| **1.1 - ප්‍රදානයන්** | | |
| රාජ්‍ය ප්‍රදානයන්- පුනරාවර්තන | | |
| වර්ෂය තුළ ලැබීම් | 38,964,130 | 32,600,000 |
| වර්ෂය තුළ ආපසු ගෙවීම් | - | (1,418,751) |
| | 38,964,130 | 31,181,249 |
| **1.2 - වෙනත් ආදායම්** | | |
| වෙනත් ආදායම | | |
| වර්ෂය තුළ ලැබීම් | 248,500 | 115,680 |
| වර්ෂය තුළ ආපසු ගෙවීම් | - | (115,680) |
| | 248,500 | - |
| විලම්භිත ආදායම් | | |
| විලම්භිත ආදායම - රාජ්‍ය ප්‍රදානයන් | 4,063,684 | 3,650,932 |
| විලම්භිත ආදායම -UNDP ප්‍රදානයන් | 14,437,126 | 19,429,295 |
| | 18,500,810 | 23,080,227 |
| මුළු ආදායම | **57,713,440** | **54,261,477** |

****2019 වර්ෂය සඳහා පුනරාවර්තන වියදම් වෙනුවෙන් අධිකාරිය සඳහා රු. 60,000,000.00 ක මුදලක් වෙන් කර ඇත. නමුත්, 2019 වර්ෂය සඳහා පුනරාවර්තන වියදම් වශයෙන් අවශ්‍යය වුයේ රු. 43,000,000.00 ක මුදලක් පමණක් වූ අතර ඉතිරි වූ රු. 17, 000, 000.00 ක ප්‍රතිපාදන මුදල, රජයේ අමාත්‍යංශය සඳහා නැවත වෙන් කරන ලදී.**

| **02 සටහන**<br>**වියදම්** | 2019<br>(රු) | 2018<br>(රු) |
|---|---|---|
| **පුද්ගලික වේතන** | | |
| වැටුප් හා වේතන | 14,269,541 | 9,950,484 |
| සේවක අර්ථසාධක අරමුදල | 2,095,156 | 1,581,254 |
| සේවක භාර අරමුදල | 523,789 | 395,314 |
| අතිකාල හා නිවාඩු දින ගෙවීම් | 1,156,276 | 767,749 |
| පාරිතෝෂික | 593,544 | 440,404 |
| වැඩ බලන දීමනා | 52,210 | 339,608 |
| ගමන් දීමනා | 1,833,871 | 1,600,000 |
| ඉන්ධන දීමනා | 1,135,290 | 1,116,210 |
| ජීවන වියදම් දීමනා | 3,055,516 | 2,424,500 |
| ගැලපුම් දීමනා | 391,921 | 1,000,807 |
| වෘත්තීය දීමනා | 288,000 | 251,526 |
| කළමනාකාර මණ්ඩල දීමනා | 1,828,000 | 1,790,000 |
| වෙනත් දීමනා | 832,151 | 1,002,000 |
| පුහුණු දීමනා | 100,000 | |
| **එකතුව** | **28,155,264** | **22,659,856** |

| 03 සටහන<br>ගමන් වියදම් | 2019<br>(රු) | 2018<br>(රු) |
|---|---|---|
| ගමන් - දේශීය | 214,217 | 91,478 |
| ගමන් - විදේශීය | 28,451 | 218,526 |
| **එකතුව** | **242,668** | **310,004** |

| 04 සටහන<br>සැපයුම් හා පාරිභෝගික භාණ්ඩ | 2019<br>(රු) | 2018<br>(රු) |
|---|---|---|
| මුද්‍රණය හා ලිපි ද්‍රව්‍ය | 1,297,649 | 737,743 |
| ඉන්ධන හා ලිහිසි තෙල් | 1,483,234 | 853,234 |
| නිල ඇඳුම් | 36,000 | 36,000 |
| විනෝද කටයුතු | 552,912 | 318,903 |
| වෙළඳ ප්‍රචාරණය | 736,362 | 646,070 |
| පුවත් පත් | 14,520 | 15,600 |
| වෙනත් සැපයුම් | 73,177 | 292,501 |
| **එකතුව** | **4,193,854** | **2,900,051** |

| 05 සටහන<br>නඩත්තුව | 2019<br>(රු) | 2018<br>(රු) |
|---|---|---|
| නඩත්තු වියදම් - වාහන | 2,282,640 | 1,501,580 |
| නඩත්තු වියදම් - පිරියත යන්ත්‍රෝපකරණ | 841,708 | 211,280 |
| නඩත්තු වියදම් - ගොඩනැගිල්ල හා ව්‍යුහය | 334,262 | 1,582,520 |
| **එකතුව** | **3,458,610** | **3,295,380** |

| 06 සටහන<br>ගිවිසුම්ගත සේවාවන් | 2019<br>(රු) | 2018<br>(රු) |
|---|---|---|
| ප්‍රවාහනය | 24,548 | 18,172 |
| විදුලි සංදේශ ගාස්තු | 764,853 | 671,686 |
| තැපැල් ගාස්තු | 74,210 | 28,600 |
| බැංකු ගාස්තු | 8,511 | - |
| විදුලිය හා ජලය | - | 16,732 |
| පවිත්‍රතා ගාස්තු | 970,507 | 766,153 |
| වෙනත් සේවාවන් -රජයේ දැනුවත් කිරීමේ වැඩසටහන් | 2,869,192 | 3,280,909 |
| වෙනත් සේවාවන් -UNDP දැනුවත් කිරීමේ වැඩසටහන් | 12,912,603 | 18,705,398 |
| වෙනත් සේවාවන් - විගණන ගාස්තු | 744,941 | - |
| වෙනත් සේවාවන් - වෙනත් | 30,899 | 26,815 |
| **එකතුව** | **18,400,264** | **23,514,465** |

| **07 සටහන** **ක්ෂය වීම** | **2019** (රු) | **2018** (රු) |
|---|---|---|
| ගොඩනැගිලි ව්‍යූහ පුනරුත්ථාපනය - රාජ්‍ය ප්‍රදානයන් | 81,685 | 32,432 |
| ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ - රාජ්‍ය ප්‍රදානයන් | 753,979 | 327,366 |
| ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ - UNDP ප්‍රදානයන් | 341,507 | 161,865 |
| පරිගණක සහ උපාංග - රාජ්‍ය ප්‍රදානයන් | 299,524 | 6,060 |
| පරිගණක සහ උපාංග - UNDP ප්‍රදානයන් | 1,162,900 | 562,032 |
| මෘදුකාංග සංවර්ධනය - රාජ්‍ය ප්‍රදානයන් | 59,305 | 4,165 |
| වෙනත්- UNDP ප්‍රදානයන් | 20,116 | - |
| **එකතුව** | **2,719,015** | **1,093,920** |

| **08 සටහන** **අතැති මුදල් හා බැංකුවේ ඇති මුදල්** | **2019** (රු) | **2018** (රු) |
|---|---|---|
| ලංකා බැංකුව -C/A-81479591 | 2,927,563 | - |
| ලංකා බැංකුව - අධිකාරියේ අරමුදල C/A-81624249 | 1,822,405 | 555,800 |
| සුළු මුදල් | - | - |
| එකතුව | **4,749,968** | **555,800.00** |

| **09 සටහන** තැන්පතු | **2019** (රු) | **2018** (රු) |
|---|---|---|
| ආපසු ලබාදෙන තැන්පතු - ඉන්ධන | 30,000 | 15,000 |
| **එකතුව** | **30,000** | **15,000.00** |

| **10 සටහන** **වෙනත් වත්කම්** | **2019** (රු) | **2018** (රු) |
|---|---|---|
| ලැබිය යුතු පොලිය- ස්ථාවර තැන්පතු | 52,435 | **-** |
| තොග | 1,525,596 | 1,159,720 |
| **එකතුව** | **1,578,031** | **1,159,720** |

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

| **11 සටහන**<br>**ආයෝජන** | **2019**<br>(රු) | **2018**<br>(රු) |
|---|---|---|
| ආයෝජන- ස්ථාවර තැන්පතු | 2,163,300 | - |
| **එකතුව** | **2,163,300** | **-** |

**12 සටහන**

අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරිය

**2019 දෙසැම්බර් 31 දිනට ස්ථාවර වත්කම්**

| තොරතුරු | ගොඩනැගිලි (රු.) | මෝටර් රථ (රු.) | ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ (රු.) | පරිගණක (රු.) | පිරියත හා යන්ත්‍රෝපකරණ (රු.) | මෘදුකාංග (රු.) | වෙනත් (රු.) | ඉඩම් (රු.) | එකතුව (රු.) |
|---|---|---|---|---|---|---|---|---|---|
| **2019 ජනවාරි 01 දිනට පිරිවැය** | 1,991,278 | **-** | **9,179,997** | 5,283,600 | **-** | 190,026 | **-** | **-** | **16,644,901** |
| එකතු කිරීම් | 294,600 | - | 3,642,016 | 2,175,000 | - | 495,200 | 287,397 | - | **6,894,213** |
| බැහැර කිරීම් | - | - | - | - | - | - | - | - | **-** |
| **2019 දෙසැම්බර් 31 දිනට පිරිවැය** | **2,285,878** | **-** | **12,822,013** | **7,458,600** | **-** | **685,226** | 287,397 | **-** | **23,539,114** |
| **2019 ජනවාරි 01 දිනට සමුච්චිත ක්ෂය** | **32,432** | **-** | **557,469** | 568,092 | **-** | 4,165 | **-** | **-** | **1,162,158** |
| ක්ෂය වීම | 81,685 | - | 1,095,486 | 1,462,424 | - | 59,305 | 20,116 | - | **2,719,015** |
| බැහැර කිරීම් | - | - | - | - | - | - | - | - | **-** |
| **2019 දෙසැම්බර් 31 දිනට සමුච්චිත ක්ෂය** | **114,117** | **-** | **1,652,955** | **2,030,516** | **-** | **63,470** | 20,116 | **-** | **3,881,174** |
| **2019 ජනවාරි 01 දිනට ලියා හළ අගය** | **1,958,846** | **-** | **8,622,528** | **4,715,508** | **-** | **185,861** | **-** | **-** | **15,482,742** |
| **2019 දෙසැම්බර් 31 දිනට ලියා හළ අගය** | **2,171,761** | **-** | **11,169,058** | **5,428,084** | **-** | **621,756** | **267,281** | **-** | **19,657,940** |

## <u>මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්</u>

| සටහන 13<br>වෙනත් බැරකම් | 2019<br>RS | 2018<br>RS |
|---|---|---|
| උපචිත වියදම්- අනෙකුත් දීමනා | - | 100,000 |
| උපචිත වියදම් - අතිකාල | 76,966 | 65,198 |
| උපචිත වියදම් - ගමන් - දේශීය | 26,850 | 10,400 |
| උපචිත වියදම් - ඉන්ධන | 114,324 | 5,000 |
| උපචිත වියදම් - විදුලි සංදේශ | 63,640 | 55,756 |
| උපචිත වියදම් - නිවාඩු දින ගෙවීම් | 21,866 | 3,441 |
| උපචිත වියදම්- වැටුප් සහ වේතන | - | 6,719 |
| උපචිත වියදම්- පුවත් පත් | 2,400 | - |
| උපචිත වියදම්- වාහන අලුත්වැඩියා | 13,927 | - |
| උපචිත වියදම්- පවිත්‍රතා | 82,858 | - |
| උපචිත වියදම්- ප්‍රවාහන | 1,200 | - |
| උපචිත වියදම්- වෙනත් | 3,000 | - |
| ආපසු ලබාදෙන තැන්පතු | 86,680 | - |
| ප්‍රතිපාදන - විගණන ගාස්තු | 744,941 | - |
| **එකතුව** | **1,238,653** | **246,514** |

| සටහන 14<br>ජංගම නොවන බැරකම් /වගකීම් | 2019<br>රු | 2018<br>රු |
|---|---|---|
| ගෙවීමට ඇති පාරිතෝෂිත (සටහන 14 (1)) | 1,033,949 | **440,404** |
| **එකතුව** | 1,033,949 | **440,404** |

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

| සටහන 14(1)<br>පාරිතෝෂිතය | 2019<br>රු | 2018<br>රු |
|---|---:|---:|
| වර්ෂාරම්භක ශේෂය | 440,404 | - |
| වර්ෂය සඳහා වන අයකිරීම් | 593,544 | 440,404 |
| වර්ෂය තුළ ගෙවූ පාරිතෝෂිත මුදල | - | - |
| එකතුව | 1,033,948 | 440,404 |

| සටහන 15<br>සමුච්චිත අරමුදල | 2019<br>රු | 2018<br>රු |
|---|---:|---:|
| ආරම්භක ශේෂය | 487,801 | - |
| වර්ෂය සඳහා වන අතිරික්ත /හිඟ | 543,765 | 487,801 |
| එකතුව | **1,031,566** | **487,801** |

| සටහන 16<br>අධිකාරි ආරක්ෂක අරමුදල | 2019<br>රු | 2018<br>රු |
|---|---:|---:|
| ආරම්භක ශේෂය | 555,800 | - |
| වර්ෂය තුළ වන මාරු කිරීම් | 3,407,340 | 555,800 |
| එකතුව | **3,963,140** | **555,800** |

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

| සටහන් 17<br>රාජ්‍ය ප්‍රාග්ධන ප්‍රදානයන් | 2019<br>(රු) | 2018<br>(රු) |
|---|---|---|
| ආරම්භක ශේෂය | 8,139,968 | 2,661,292 |
| වර්ෂය තුළ ලැබීම් | 10,730,000 | 11,212,000 |
| වර්ෂය තුළ ආපසු ගෙවීම් | - | (2,082,393) |
| වර්ෂය තුළ විලම්භිත | (4,063,684) | (3,650,932) |
| **එකතුව** | **14,806,284** | **8,139,968** |

| සටහන 18<br>එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන ප්‍රාග්ධන ප්‍රදානයන් | 2019<br>රු | 2018<br>රු |
|---|---|---|
| ආරම්භක ශේෂය | 7,342,774 | - |
| එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන යටතේ ලද ස්ථාවර වත්කම් ප්‍රදානයක් - වර්ෂය තුළ ලැබීම් | 287,397 | 8,066,671 |
| එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන යටතේ ලද ප්‍රාග්ධන ප්‍රදානයන් - වර්ෂය තුළ ලැබීම් | 12,912,603 | 21,660,500 |
| වර්ෂය තුළ ආපසු ගෙවීම් | - | (2,955,102) |
| වර්ෂය තුළ විලම්භිත | (14,437,126) | (19,429,295) |
| **එකතුව** | **6,105,648** | **7,342,774** |

**අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරිය**

**2019 දෙසැම්බර් 31 දින අවසන් වූ වර්ෂය සඳහා අධිකාරි ආරක්ෂණ අරමුදලේ ආදායම් වියදම් ප්‍රකාශනය**

| **විස්තරය** | එකතුව<br>(රු) |
|---|---|
| <u>**අධිකරණයෙන් ලද අදායම**</u><br><br>දඩ මුදල් එකතුව | 3,357,225 |
| **මුළු එකතුව (අ)** | **3,357,225** |
| **එකතු කළා : පොලී ආදායම** | 52,435 |
| **මුළු පොලිය (ආ)** | **52,435** |
| **අඩු කළා: වියදම්** | |
| බැංකු ගාස්තු | (100) |
| වන්දි | (2,220) |
| රඳවා ගැනීමේ බදු | - |
| **මුළු වියදම ( ඇ )** | **(2,320)** |
| | |
| **ශුද්ධ ඉතිරිය (අ) + (ආ) + ( ඇ )** | **3,407,340** |

අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරිය
එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන සඳහා වන වියදම් වාර්තාව
කාල සීමාව : 2019.01.01 සිට 2019.12.31 දක්වා

| වාර්ෂික ඉලක්ක ඇතුළුව අපේක්ෂිත ප්‍රථිපල සහ දර්ශකයන් | **සැලසුම් ගත ක්‍රියාකාරකම්**<br>ප්‍රකාශිත ප්‍රතිඵල ලබා ගැනීම සඳහා වසර තුළ සිදු කළ ක්‍රියාකාරකම් ලැයිස්තුව | **සැලසුම් ගත අයවැය - 2019** | | **ගෙවීම් හා වියදම් (රු)** | | |
|---|---|---|---|---|---|---|
| | | අයවැය විස්තරය | මුදල | ගෙවීම් | වියදම් | ඉතිරි මුදල |
| | <u>**පවත්වන ලද වැඩසටහන්**</u> | | (රු) | (රු) | (රු) | (රු) |
| | අපරාධයක වින්දිතයන්ගේ සහ සාක්ෂිකරුවන්ගේ සහාය සහ ආරක්ෂක කොට්ඨාසයේ නිලධරයන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම (අදාළ පනතේ 13 (ඕ) වගන්තිය | | 1,210,000 | 1,210,000 | 1,210,000 | - |
| | අදාළ නීතිය බලාත්මක කිරීමට සම්බන්ධ වන ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය, පොලිස්පති, නීතිපති දෙපර්තමේන්තුව,අධිකරණ වෛද්‍ය නිලධාරීන්,ශ්‍රී ලංකා නීතිඥවරුනගේ සංගමය, බන්ධනාගාර දෙපාර්තමේන්තුව, කාන්තා හා ළමා කටයුතු අමාත්‍යංශය, නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යංශය, අධිකරණ අමාත්‍යංශය, නීති ආධාර කොමිෂන් සභාව යන ආයතන වලට අදාළ නිලධාරීන් සහ අධිකරණ වෛද්‍ය නිලධාරීන් සඳහා පුහුණු හා දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම (අදාළ පනතේ 13 (ඕ) වගන්තිය) | | 11,810,000 | 11,810,000 | 11,702,603 | 107,397 |
| | ජාතික අධිකාරියට අවශ්‍ය වන උපකරණ සපයාදීම, අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් විසින් කෙරෙන ඉල්ලීම් සහ පැමිණිලි සම්බන්ධ ප්‍රගතිය ගණනය කිරීම උදෙසා ස්වයංක්‍රීය සිද්ධි කළමනාකරණ දත්ත ගබඩාවක් සකස් කිරීම, ජාතික අධිකාරිය සඳහා වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සම්බන්ධ පුස්තකාලයක් සහ පර්යේෂණ මධ්‍යස්ථානයක් ස්ථාපනය කිරීම | | 180,000 | 180,000 | 287,397 | (107,397) |
| | **මුළු ගණන** | | **13,200,000** | **13,200,000** | **13,200,000** | **-** |

අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරිය

ආයෝජන ලේඛනය

කාල සීමාව : 2019.01.01 සිට 2019.12.31 දක්වා

| ආයෝජිතයා /බැංකුව | සහතික අංකය | ආයෝජන | | | | | කාලසීමාව | වාර්ෂික පොලී අනුපාතිකය | ලැබිය යුතු මුළු පොලිය (රු) | කල් පිරීමේ දී අගය (රු) | මුළු රඳවා ගැනීමේ බද්ද 5% දී (රු) | ලැබිය යුතු ශුද්ධ පොලිය( රු) | ශුද්ධ කල් පිරීමේ දී අගය (රු) | ලැබිය යුතු පොලිය(රු) | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | දිනය | | නව (ලද පොලිය) | මුහුණත අගය (පැරණි) | ආයෝජිත මුදල (රු) | | | | | | | | 2019 | 2020 | එකතුව |
| | | ආයෝජන | කල් පිරෙන | | | | | | | | | | | | | |
| BOC | 84941500 | 2019 ඔක් 03 | 2020 ඔක් 05 | | | 2,163,300 | මාස 12 | 9.83% | 214,400 | 2,377,700 | - | 214,400 | 2,377,700 | 52,435 | 161,965 | 214,400 |
| | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | - | - | - | - | - | | | - |
| | | | | | | - | | | - | - | - | - | - | | | - |
| | | | | **-** | **-** | **2,163,300** | **-** | | **214,400** | **2,377,700** | **-** | **214,400** | **2,377,700** | **52,435** | **161,965** | **214,400** |

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. JPA/B/NAPVCW/FA/01/19/35 | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date 2020 අගෝස්තු 12 දින

අධ්‍යක්ෂ ජනරාල්

අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරිය

**අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරියේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මතය**

අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරියේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

අධිකාරියේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

අංක 306/72, පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11-2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

## 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අධිකාරිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය අධිකාරිය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අධිකාරියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අධිකාරියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, අධිකාරියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාචෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාචෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස අධිකාරියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තු වල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කල අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා අධිකාරිය පවත්වාගෙන ගොස් තිබුණි.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (III) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට අධිකාරිය සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් ඍජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ අධිකාරියේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

| නීතිරීති / විධානයට යොමුව | විස්තරය |
|---|---|
| (අ)2015 අංක 4 දරන අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනතේ 29 (5) වගන්තිය | අධිකාරිය සතුව ආරක්ෂන අරමුදලක් තිබිය යුතු අතර, අරමුදලේ ආදායම් හා වියදම් සහ වත්කම් හා බැරකම් පිළිබඳ නිසි ගිණුම් තැබිය යුතු වුවත් ආරක්ෂන අරමුදලේ වත්කම් හා බැරකම් අධිකාරියේ ශේෂ පත්‍රයට ඇතුලත් කර දක්වා තිබුණි. |

| | |
|---|---|
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 1646 (ඇ) | සමාලෝචිත වර්ෂයට අදාලව අධිකාරියේ වාහන සම්බන්ධයෙන් පොදු 268 (අ) ආකෘති පත්‍රයෙහි ලියන ලද ගමන් පිළිබඳ මාසික සාරාංශයේ මුල් පිටපත ද සමඟ ඒ ඒ මාසයේ දෛනික ධාවන සටහන්, 2020 ජූලි 10 දින වන විටත් විගණකාධිපති වෙත එවා නොතිබුණි. |

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණය හැර අධිකාරියේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

  2015 අංක 4 දරන අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනතේ IV වන කොටසේ 12 (1) උප වගන්තිය ප්‍රකාරව අධිකාරියේ කටයුතු පරිපාලනය කිරීම සහ කළමනාකරණය කිරීම කළමනාකරණ මණ්ඩලයකට පැවරිය යුතු වුවද 2019 නොවැම්බර් 19 දින සිට කළමනාකරණ මණ්ඩලයක් පත් කර නොතිබූ අතර ඒ හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල වගකීම භාර ගැනීම සම්බන්ධයෙන් ගැටළු සහගත තත්වයක් පැවතුණි.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර අධිකාරියේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව

  (අ) දැනුවත් කිරීමේ වැඩ සටහන් තරගකාරී මිළගණන් කැඳවීමකින් තොරව බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ (BMICH) පැවැත්වීමට අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා අංක 19/2019 මගින් තීරණය කර තිබුණි. ඒ අනුව අධිකාරිය විසින් කොළඹ දිස්ත්‍රික්කයේ දැනුවත් කිරීමේ වැඩසටහන් 6 ක් එහි පවත්වා තිබූ අතර පලමුව මිලගණන් කැඳවූ අවස්ථාවේ දී අඩුම මිළගණන් ඉදිරිපත් කර තිබූ ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ (SLIDA) පැවැත්වූයේ නම් අධිකාරියට රු. 3,094,569 ක මුදලක් ඉතිරි කර ගත හැකිව තිබුණි.

  (ආ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 9.8 (ඇ) උප වගන්තිය ප්‍රකාරව විද්‍යුත් මාධ්‍යයෙන් ලංසු ඉදිරිපත් කිරීමට අවසර දෙනු නොලැබෙන බව දක්වා තිබුණත්, රු.183,015 ක මිලදී ගැනීමක් සඳහා පෞද්ගලික පොත්හලකින් 2018 ඔක්තෝබර් 10 දින සහ අවස්ථා 06 කදී එකතුව රු. 4,704,819 කට අදාල දැනුවත් කිරීමේ වැඩසටහන් සඳහා බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ (BMICH) විද්‍යුත් තැපැල් (Gmail) මගින් ඉදිරිපත් කළ මිළ ගණන් පිළිගෙන තිබුණි.

## 3 වෙනත් විගණන නිරීක්ෂණ

(අ) අයවැය ඇස්තමේන්තු පිළියෙල කිරීමේදී ආයතනයේ ක්‍රියාකාරී සැලැස්ම හා පදනම්ව සැලසුම්ගත කාර්යයන් වෙනුවෙන් ප්‍රතිපාදන වෙන්කර ගැනීම කලයුතු වුවත් අධිකාරිය විසින් සමාලෝචිත වර්ෂය සඳහා අධි ඇස්තමේන්තු පිළියෙල කිරීම නිසා ඉතිරි වූ රු. මිලියන 17 ක මුදලක් අමාත්‍යාංශය වෙත ආපසු යවා තිබුණි.

(ආ) 2016, 2017,2018 හා 2019 වර්ෂවලදී අධිකාරියට ලැබී තිබූ පැමිණිලි සංඛ්‍යාව පිළිවෙලින් 12, 49, 86 හා 252 ක් ලෙස එකතුව 399 ක් විය. වසර හතර තුල අවසන් කරන ලද මුළු පැමිණිලි සංඛ්‍යාව 153 ක් වූ අතර එය පිළිවෙලින් 8,37,47 හා 61 ක් විය. එය ලද පැමිණිලි සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස සියයට 66, 75, 55 හා 24 ක් විය. අධිකාරිය විසින් මෙතෙක් ආරක්ෂක අංශය හෝ සහායක අංශය ස්ථාපිත කර නොමැති හෙයින් සහාය ඉල්ලා කරන ලද ඉල්ලීම් 16 ක කටයුතු නීති අංශය විසින් සිදු කර තිබූ අතර ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුවේ අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන්ගේ සහයක සහ ආරක්ෂක කොට්ඨාසය වෙත පැමිණිලි 81 ක් යොමු කර තිබුණි.

(ඇ) අදාල කාර්යයට ප්‍රමාණවත් මුදලක් කාර්යය සඳහා පිළියෙල කරන ඇස්තමේන්තු මත පදනම්ව ලබා දිය යුතු වුවද, අවස්ථා 26 ක දී ලබා දුන් අත්තිකාරම් මුදල් රු. 785,675 ක් හා වියදම රු. 414,894 ක් වූයෙන් රු. 370,781 ක් ප්‍රමාණය ඉක්මවා ලබා දී තිබුණි. එය සියයට 25 සිට සියයට 100 ක පරාසයක විය.

(ඈ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.11.3 වගන්තිය ප්‍රකාරව ප්‍රසම්පාදන අවස්ථා 2 කදී ලංසු ඇගැයීම් සාරාංශ වාර්තාවක් පිළියෙල කර නොතිබුණි.

(ඉ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 9.8 (අ) උප වගන්තිය අනුව ප්‍රසම්පාදන අස්ථීත්වය කැමැති නම් සාමාන්‍ය ප්‍රචාරක දැන්වීම් ක්‍රියාවලියට අමතරව ප්‍රසම්පාදන ආරාධනාවන් වෙබ් අඩවියෙහි පල කිරීම කලහැකි වුවත්, පුස්තකාල පොත් මිළ දී ගැනීමේ දී විද්‍යුත් තැපැල (Gmail) මගින් මිළගණන් ඉල්ලීම කර තිබීමෙන් උක්ත ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන වලින් බැහැරව කටයුතු කර තිබුණි.

(ඊ) අධිකාරියේ අනුමත සේවක සංඛ්‍යාව 55 ක් වූ නමුත් 2019 දෙසැම්බර් 31 දින වන විට තථ්‍ය සංඛ්‍යාව 38ක් විය. ආයතනයේ කාර්යභාරය ඉටු කිරීම සඳහා සෘජුවම බලපාන තනතුරු 14 ක් පුරප්පාඩුව පැවතුණි.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති